ස යු රෙ න්

# එතෙර

**එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය**

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
ISSN 1391 5145
2022 ජූලි



සමුද්‍රගිරි පිච්ච මල් විහාරය - කුච්චවේලි

ඡායාරූපය අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී.

# සමුද්‍රගිරි පිච්චමල් විහාරය - කුච්චවේලි

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුචචිවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුච්චවේලි පොලීසියට යාබදව කුචචිවේලි තානායම තිබූ භූමිය හා ඒ අවට හමුවන නටඹුන් සහිත ප්‍රදේශය වර්තමානයේ පිච්චමල් විහාරය යන නමින් හඳුන්වනු ලබයි.**



මෙම ස්ථානය මුහුදට ආසන්නයේ පිහිටීම නිසා සමුද්‍ර විහාරයන්ට අයත් එකක් විය හැකි බව වියතුන්ගේ මතයයි. පෙර රජ දවස කණිකාරවෙල්ලික විහාරය ලෙස හඳුන්වා ඇති මෙම වෙහෙර ආශ්‍රිතව පවතින නටඹුන් දෙස බැලූ කල මෙය අනුරාධපුර මුල් යුගයේ දියුණු ආරාමයක්ව පැවති බව පෙනී යන්නේය.






බුදුමැදුරක හා සංඝාවාසයන්හි අත්තිවරම් මෙම නටඹුන් පරිශ්‍රයෙන් හමුවන අතර සංස්කෘතික බසින් ලියැවුනු ශිලා ලිපියක්ද හමුවේ. එය සංස්කෘතික බසින් රචිත පළමු ශිලා ලිපිය බවට මතවාද ඇතත් මෙරටින් හමුවූ පළමු සංස්කෘතිත ශිලා ලිපිය මෙය බවට මහාචාර්ය සෙනරත් පරණවිතානයන් පවසයි.

ක්‍රිස්වර්ෂ හය හෝ හත්වන සියවසෙහි මෙම ලිපිය ලියන්නට ඇති බව වියතුන්ගේ පිළිගැනීමයි.

සංස්කෘතික භාෂාව මුල් බැසගත් මහායාන දහම බල පැවැත්වූ භික්ෂු ආරාම සංකීර්ණයක් මෙම ප්‍රදේශයේ එදා දක්නට තිබී ඇති බවත් මේවා සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබී තිබූ බව විහාරය ආශ්‍රීතව ලැබෙන සංස්කෘතික සෙල් ලිපි ඇසුරින් හඳුනාගත හැකිය.


රුවන් වැලි සෑය වන්දනා කිරීම සඳහා දුටු ගැමුණු රජතුමාට පිච්චමල් ගෙන ගියේ මෙම ප්‍රදේශයෙන් බවත් එම නිසා මෙම විහාරය පිච්චමලී විහාරය ලෙස හඳුන්වා ඇති බව ජනප්‍රවාදයන්ට අනුව කියැවේ.

මෙම ස්ථානයෙන් හමුවන එක් පිළිම ගෙයක බැම්ම සඳහා යාපනය අර්ධද්වීපයට ආවේනික වූ හුණුගල් යොදා ගෙන ඇති බව පෙනීයයි.නටඹුන් වලට අයත් ගල් කණු කිහිපයක් කුච්චවේලි පොලීසිය පවතින භූමිය තුළ දක්නට ලැබේ.



හුනු ගල් වලින් නිර්මාණය කරන ලද ගොඩනැගිල්ල අසල පොලවේ කැනීම් කිරීමේදී මතුපිට පොලවෙන් අඩි හයක් පමණ ගැඹුරින් වැළලී තිබූ බුදු පිළිමයක් හා සිරස් දෙකක් හමුව තිබේ. මෙම පිළිමය හිටි පිළිමයක්. මෙම ප්‍රතිමා කැබලි ඒ මේ අත විසිරී පොලව යට තිබී සොයා ගැණිනි. මෙම ප්‍රතිමා කළාව දෙස බැලූ කළ එය ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත් බව නිගමනය කළ හැකි බව පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් පවසයි.

එම පිළිම අසලින් රෝම කාසි කිහිපයක්ද වළං කැබලි කිහිපයක්ද සොයා ගැනීමට හැකි වී ඇත. කෙනීම් කර මතු කර ගත් සියලු දේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එම ස්ථානයේම පවත්වාගෙන යන කෞතුකාගාරයේ තබා ඇත.



# ඒ ඒ රටවල රෝගීන්ගේ ආහාර වේල රසවත් දැයි බලන්න.



මෙය කියවන සියලු දෙනා ම රජයේ රෝහලක එක්දිනක් හෝ නේවාසිකව ප්‍රතිකාර ලබා ඇතැයි සිතමු. නේවාසික රෝගීන් සඳහා රෝහලෙන් දිනපතා ආහාර වේල් තුනම ලබා දෙයි. මෙහි ආහාර වේල් ප්‍රනීත බව පිළිබඳව නම් සෑහීමකට පත්වන අයෙක් සිටීද යන්න සැක සහිත වුවත් එය අපගේ දෛනික ආහාර වේලට වඩා රෝගීන් වෙනුවෙන්ම සකස් කරන ලද්දකි. රෝගාතුර වීමෙන් පසු සුව වීමේ ක්‍රියාවලියේදී සෘජුව ලබාදෙන ඖෂධ මෙන්ම එදිනෙදා ආහාර වේල මගින් ද සුව වීමේ ක්‍රියාව ඉක්මන් කිරීමට විශාල දායකත්වයක් ලබාදෙයි. රෝගය සඳහා ඔරොත්තු දීමට ශරීර ප්‍රතිශක්තිකරණය ඇති කිරීම ද විශේෂයෙන් ම සැත්කම් සඳහා යොමු කිරීමෙන් පසුව කැපුම් සුවවීම සඳහා ප්‍රෝටීන් වැනි පෝෂ්‍ය පදාර්ථ සහිත ආහාර ලබාගැනීම ඉතාමත් වැදගත් වේ. ලෝකයේ විවිධ රටවල මේ සඳහා නිර්දේශිත රෝහල් තුළ ලබාදෙන ආහාර වට්ටෝරු පිළිබඳව සොයාබැලීමකි. රට තුළ විවිධ ප්‍රදේශයන්හි දී මෙම වට්ටෝරු වෙනස් විය හැකිය.

## මෙක්සිකෝව



මෙක්සිකෝ සමාජ ආරක්ෂණ ආයතනය විසින් රෝගීන් සඳහා ලබාදෙන ආහාර වට්ටෝරුව තුළ අපට හුරු පුරු ආහාර වර්ගවලින්ම සමන්විත වෙයි. බදින ලද බිත්තරයක්, ගම්මිරිස් කුඩු සමග තක්කාලි සලාදයක් කුඩා කැබලි ලෙස කැපූ ඉදුනු ගස්ලබු සහ වතුර වීදුරුවක් ඔවුන් රෝගීන් සඳහා නිර්දේශ කරයි.

## එක්සත් ජනපදය




එක්සත් ජනපදය තුළ ලබා දෙන ආහාර වට්ටෝරුවේ කකුල් මස් වලින් සකසා ගන්නා චිකන් පොට් පායි නම් ආහාරයද, බ්‍රොකෝලි නම් ගෝවා වර්ගයද, චොකලට් සහ කෝපි කෝප්පයක් අඩංගු වේ chicken pot pie විවිධ රසයන් සහිතව විවිධාකාර ලෙස සකසා ආහාරයට ගන්නා එරට ප්‍රචලිත ආහාරයකි.

## කැනඩාව



කැනඩාවේ රෝහලකදී ලැබෙන ආහාර වට්ටෝරුව තුළ පිසින ලද සැමන් මාලු මුං ඇට, ඉරිඟු සහ වතුර වීදුරුවක් අඩංගුය. සැමන් මත්ස්‍ය ආහාර කැනඩාව තුළ ඉතා ප්‍රචලිත අතර ලෝකය තුල සැමන් අපනයනය අතින් ද කැනඩාව ඉදිරියෙන්ම සිටින රටකි.

## ජර්මනිය




ජර්මනියේ රෝහල් තුළ ලබාදෙන ආහාර වට්ටෝරුවයි මේ. එහි යොදය සමඟ හරක් මස්, මුං ඇට, ඉරිඟු, ස්ටඩෙල් නමින් හඳුන්වන පේස්ට්‍රි වර්ගයක් සහ පාන් අඩංගුය.

## ස්පාඤ්ඤය




ස්පාඤ්ඤ ජාතික සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කරන ලද ආහාර ට්ටෝරුවේ ගම්මිරිස් බතක් සමඟ චොරිට්සෝ නම් සොසේජස් මිශ්‍රණයක්, පළතුරු සලාදයක් සහ දොඩම් යුෂ වීදුරුවක් අඩංගුය. චොරිට්සෝ තුළ ප්‍රධාන අඩංගුකාරකය වන්නේ පුලුස්සාගත් ඌරු මස්ය.

## ඕස්ට්‍රේලියාව



ඕස්ට්‍රේලියාවේ රෝහල් සඳහා නිර්දේශ කළ ආහාර වට්ටෝරුව තුළ ප්ලම් සමඟ කකුල් මස්, බත්, කපාගත් ඇපල්, සහ ක්‍රැන්බෙරි යුෂ වීදුරුවක් අඩංගු වෙයි.

## දකුණු අප්‍රිකාව




කකුල් මස්, පරිප්පු ව්‍යාංජනයක්, බත්, එලවලුවක් සහ කිරි වීදුරුවක් ලබාදීම සුදුසු බවට දකුණු අප්‍රිකාවේ නිර්දේශ කර ඇත.

## ඉතාලිය



ඉතාලියේ රෝගීන් සඳහා ලබාදෙන ආහාර වට්ටෝරුවේ ඇත්තේ අර්තාපල්, චීස්, සහ බිත්තර මගින් සකසා ගන්නා නොකී නම් ආහාරයක් සමග පලතුරු සහ ජලය යි. මෙම නොකී තක්කාලි සෝස් සමඟ පිරිනමනු ලැබේ. නොකී යනු ඉතාලියටම ආවේක විශේෂිත ආහාරයකි.

## බ්‍රිතාන්‍යය




බ්‍රිතාන්‍යයේ දී කෝනිෂ් පේස්ට් සමඟ සැවෝයි ගෝවා, බත්වලින් සැකසූ පුඩිමක් සහ තේ කෝප්පයක් ලබා දෙයි.

## ජපානය



මුහුදු ආහාරවලින් සැකසූ නූඩ්ල්ස් සහ හරිත තේ ජපානයේදී ලබා දෙයි.

## රුසියාව



රුසියාවේ දී Buckwheat නම් ධාන්‍ය වර්ගයෙන් සැකසූ පුඩිමක් සහ නැවුම් චීස් සමගින් කෝපි කෝප්පයක් ලබාදෙයි. මෙම buckwheat අප දන්නා බඩ ඉරුඟු වර්ගය නම් නොවේ.

## ස්විට්සර්ලන්තය



ස්විට්සර්ලන්ත රෝහල්වල ලබාදෙන ආහාර වේලෙහි කිෂි නම් ආහාරයක්, walnut නම් පලතුරු ඇට වර්යෙන් සැකසූ සලාදයක්, චොක්ලට් සහ ක්‍රීම් සහිත Eclair නම් පේස්ට්‍රි වර්ගයක් සහ ඇපල් යුෂ අඩංගු වේ. කිෂි යනු බිත්තර කිරි චීස් මස් එලවලූ වැනි බොහෝ දේ යොදා සකසා ගන්නා ප්‍රනීත ආහාරයකි.

සටහන: චතුර්ක මධුෂාන් මූලාශ්‍රය: theguardian.com

# ගෝඨාභය ගේ පලායෑම හා රනිල් ගේ ආගමනය





ගාලු මුවදොර පිටියේ ආරම්භ කළ "ගෝඨා ගෝ හෝම්" අරගලය දියුණු තියුණු වෙමින් තිබුණි. එයට සමගාමීව රට පුරා ද එවැනි අරගල භූමි බිහිවිය. මහනුවර ගාල්ල මාතර ආදී ප්‍රදේශවල ද ගෝඨා ගෝ ගම්මාන බිහිවීම ආරම්භ විය. එය රට පුරා නැගුණ රැල්ලක් බවට පත්විය. මෙය මර්ධනය කිරීමේ රාජ්‍ය වැඩ පිළිවෙලක් නොතිබුණි. ජනමාධ්‍ය විසින් මෙය තව දුරටත් දියුණු තියුණු කළහ.

පොලීසියේ හෝ හමුදාවේ බලය යොදා එය මර්ධනය කිරීමට ජනාධිපති ගෝඨාභය උත්සාහ කළේ නැත. ආර්ථික දරිද්‍රතාවය, තෙල් ගෑස් විදුලිය හිඟවීම තෙල් පිරවුම්හල්වල දීර්ඝ පෝලිම් දිනපතා වැඩි දියුණු විය. රාජ්‍ය භාණ්ඩාගාරයේ විදේශ සංචිත හිඟවීම මෙයට ප්‍රධාන හේතුව විය. මූල්‍ය හිඟතාවයේ සම්පූර්ණ චෝදනාව රජයට හා ජනාධිපතිවරයාට එල්ල කළ අරගලකරුවන් වෘත්තීය සමිති නීතිඥ සංගම් ද ඇතුලු විවිධ බහු විද සංවිධාන උද්ඝෝෂණයට කැඳවා ගත්හ. විචාරයකින් තොර ජනතාවටද ආවේගශීලී තරුණ කොටසද විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවද මෙයට එක්කර ගනිමින් රැල්ලක් නිර්මාණය කළහ.

ජාතික තලයේ ජනමාධ්‍යය උද්ඝෝෂණයට වැඩි බරක් දී ඒ සඳහා විශාල ප්‍රචාරයක් ලබා දුන්හ. සමාජ මාධ්‍ය හරහා දැවැන්ත ප්‍රචාරයක් ඇති කළ අතර සමාජ මාධ්‍ය ක්‍රියාධරයන් උද්ඝෝෂණයේ වැඩි බර සියතට ගත්හ.

කලාකරුවන් විශ්ව විද්‍යාල ආචාර්ය මහාචාර්යාදීන් පෙරමුණේ සිටියහ. යම් යම් දේශපාලන පක්ෂ තම අභිමතයන් ඉටුකර ගැනීම සඳහා මේ තුළට ඇතුලු වී කටයුතු කරමින් ඔවුන් ගේ ශක්තිය උපරිමයෙන් ලබා දුන්හ. අරගලකරුවන් උදෙසා අවශ්‍ය යටිතල පහසුකම් ආහාරපාන ඉදුම් හිටුම් නොවඩුව ලැබුණි.

**අගමැතිවරයා ඉල්ලා අස්විය. අගමැති ධූරය භාරගැනීම සඳහා පාර්ලිමේන්තුව තුළ කිසිම දේශපාලන පක්ෂයක් ඉදිරිපත් නොවූහ. එක් මන්ත්‍රී ධූරයක් පමණක් හිමි එ.ජා.ප. නායක රනිල් වික්‍රමසිංහ පමණක් එයට කැමැත්ත දැක්වීය. ඔහු ලංකාවේ හය වෙනි වරට අගමැති ධූරයට පත්විය.**

විදෙස් සංවිධාන ද මේ සඳහා සෘජුව මැදිහත් විය. රජය විසින් මේසා විශාල ලෙස රජයට එරෙහි එන උද්ඝෝෂණය මර්ධනය කිරීමට කිසිඳු පියවරක් නොගත්තේය.

මැයි මස 9 වැනි දින බොහෝ පිරිස් සිතුවේ අගමැති අස්වේවි යන්නය. අගමැති මහින්ද රාජපක්ෂ ශක්තිමත් කිරීමට යැයි අගමැති නිල නිවස වූ අරලිය ගහ මන්දිරයට පාක්ෂිකයින් පැමිණි අතර ඒ සඳහා මැති ඇමතිවරු කීප දෙනෙක් නායකත්වය ලබා දුන්හ.

මේ පැමිණි පිරිස අරගල භූමියේ සිටි අරගලකරුවන්ට පහර දුන්හ. අනතුරුව අරගල කරුවන්ද මොවුන්ට පහර දුන්හ. එය අවසන් වූයේ මැති ඇමති නිවාස හා දේපොල 70 ට අධික ප්‍රමාණයක් ගිනිබත් කරමිනි. මෙම සිදුවීමෙන් පසු අරගල කරුවන් දණ්ඩෙන් පහර කෑ නාගයන් මෙන් කිපුනහ. ඔවුන් වඩාත් හොඳින් සංවිධානය වූහ.

එදාම සවස අගමැතිවරයා ඉල්ලා අස්විය. අගමැති ධූරය භාරගැනීම සඳහා පාර්ලිමේන්තුව තුළ කිසිම දේශපාලන පක්ෂයක් ඉදිරිපත් නොවූහ. එක් මන්ත්‍රී ධූරයක් පමණක් හිමි එ.ජා.ප. නායක රනිල් වික්‍රමසිංහ පමණක් එයට කැමැත්ත දැක්වීය. ඔහු ලංකාවේ හය වෙනි වරට අගමැති ධූරයට පත්විය.



ඉන් මාස දෙකකින් එනම් ජූලි 09 වනදා අරගලකරුවන් දහස් ගණනින් කොළඹට එක්වූහ. ඔවුන්ගේ අරමුණ වූයේ ජනාධිපති මන්දිරය වැටලීමයි.

5 වෙනි පිටුවට...

4 වෙනි පිටුවෙන්....

# ගෝඨාභය ගේ පලායෑම හා රනිල් ගේ ආගමනය

ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් කොළඹට එක්වී ජනාධිපති මන්දිරය වටකළහ. ජනාධිපති මන්දිරයේ ගේට්ටුව අසලට අරගල කරුවන් පැමිණෙන තෙක්ම ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීමට ජනාධිපතිගෙන් නියෝග නොලැබුණි. අරගල කරුවෝ මන්දිරයේ ගේට්ටුව බිඳ දැමීමට ආසන්න වනවිට ජනාධිපති ගේ ආරක්ෂක නිලධාරීන් ඒ බව ඔහුට දැන්වීය.

"ඔබතුමා අණ නොදුන්නොත් ඊළගට අපිට සිදුවෙනවා මොවුන්ට වෙඩි තබා හෝ ඔබව ආරක්ෂා කරන්න."

එසේ ප්‍රකාශ කළේ ජනාධිපති ගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියාය. "වෙඩි තියන්න එපා. මම යන්නම්" එය ජනාධිපති ගෝඨාභය ගේ අවසාන නියෝගය විය. ඒ අනුව ජනාධිපති ගෝඨාභය එහි තිබූ රහස් දොරටුවකින් ජනාධිපති මන්දිරයෙන් පිටවිය. ජනාධිපති වරයා ජනාධිපති මන්දිරයෙන් පිටවී විනාඩි අටක් වැනි කෙටි කාලයක් තුළ අරගලකරුවන් ජනාධිපති මන්දිරයේ ගේට්ටු හා බාධක කඩාගෙන මන්දිරය තුළට ඇතුල් වූහ.

ඒ සමගම ජනාධිපති ලේකම් කාර්යාලය අග්‍රාමාත්‍ය නිලනිවස වූ අරලියගහ මන්දිරය ආදී රටේ මර්මස්ථාන ද අරගලකරුවන් අතට පත්විය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා එම ආර්යාව නැව් මගින් ත්‍රිකුණාමලයටත් එතනින් ගුවන් මගින් කටුනායකටත් පැමිණ පසුදා මාලදිවයින දක්වාත් මාල දිවයිනෙන් සිංගප්පූරුවටත් ගිය ගමන් වාරය අතර වැඩ බලන ජනාධිපති වරයා ලෙසින් අගමැති රනිල් වික්‍රමසිංහව පත්කිරීමට ජනාධිපති ගෝඨාභය අමතක කළේ නැත.

සිංගප්පූරුවට ගිය ජනාධිපතිවරයා එහි සිට සිය ධූරයෙන් අස්වීම් ලිපිය ප්‍රකාශයට පත් කළේය. ඒ සමගම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකාවේ අටවන විධායක ජනාධිපති ධූරයට ව්‍යවස්ථානුකූලව තාවකාලිකව බලයට පත්විය.

ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධූරය හිස් වූ විට අගමැතිවරයා ජනාධිපති බවට පත්වන අතර ඉන් මාස තුනකට නොවඩු කාලයක් තුළ පාර්ලිමේන්තුවේ අනුමැතියෙන් ස්ථිර ජනාධිපතිවරයෙකු පත්කර ගැනීම නීතිය වනු ඇත.

එම නීති ප්‍රකාරව ජූලි මස 20 වනදා නව ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව හදිසියේ රැස්වීය. අපෙක්ෂකයින් එක් අයෙකුට වඩා සිටින අවස්ථාවේ රහස් චන්දයක් මගින් ජන්දය විමසා සියයට 50 ඉක්මවූ ජන්ද ප්‍රමාණයක් ලබා ගන්නා පුද්ගලයා ඉදිරි කාලය සඳහා තේරී පත්වනු ඇත. ඒ අනුව මෙම ජූලි 20 වනදා අපේක්ෂකයින් තිදෙනෙකු ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූහ.

**ජනාධිපති ලේකම් කාර්යාලය අග්‍රාමාත්‍ය නිලනිවස වූ අරලියගහ මන්දිරය ආදී රටේ මර්මස්ථාන ද අරගලකරුවන් අතට පත්විය.**

ඒ වන විට වැඩ බලන ජනාධිපති වූ රනිල් වික්‍රමසිංහ ඩලස් අලහප්පෙරුම හා අනුර කුමාර දිසානායක යන අයට එයට එක්වූහ. අපේක්ෂකයින් එක් අයෙකුට වඩා වැඩි වූ බැවින් ජන්දයක් විමසීමට සිදුවිය. රහස් ජන්දයෙන් රනිල් වික්‍රමසිංහ මහතා ජන්ද 134 ක් ලබාගත් අතර ඩලස් අලහප්පෙරුම මහතා ජන්ද 82 ක් ලබා ගත්තේය. අනුර කුමාර දිසානායක මහතාට ජන්ද 3 ක් හිමි විය. හතර දෙනෙකු ජන්දය දැමීමෙන් වැළකී සිටි අතර දෙදෙනෙකුගේ ජන්ද අවලංගු විය. මුලු ජන්ද සංඛ්‍යාව 225 කි. ඒ අනුව රනිල් වික්‍රමසිංහ මහතා නව ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්විය.

රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුව න්යෝජනය කළේ එ.ජා.ප. ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු වශයෙනි. පසුගිය පාර්ලිමේන්තු මැතිවරනයේදී එම පක්ෂයට අන්ත පරාජයක් සිදුවූ අතර රටේම ලබාගත් ජන්ද සංඛ්‍යාවට පදනම් කරගන එම පක්ෂයට එක් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයක් හිමි විය. එම ලැබුණු මන්ත්‍රී ධූරය සඳහා පාර්ලිමේන්තුවට පැමිණියේ රනිල් වික්‍රමසිංහ මහතාය. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයකින් පාර්ලිමේන්තුවට පැමිණ තම පක්ෂය වෙනුවෙන් එකම ජන්දයක් පමණක් හිමිව තිබූ එතුමා ජන්ද 134 ක් ලබා ගෙන රටේ අටවන විධායක ජනාධිපති ධූරයට පත්වීමත් හාස්කමක් බඳු සිදුවීමකි. එම ධූරයේ කටයුතු කිරීම සඳහා තව වසර දෙකහමාරකට අධික කාලයක් ඔහුට ඇත.






# සම්බුදු දළදාව වැඩමෙව් ඇත් රජුට යහපත් හවක් අත්වේවා සැනසුමට

**ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ ප්‍රධාන මුදුන් මල්කඩසේම පූජෝපහාරයට ලක්වන මහනුවර දළදා වහන්සේ මෙරට රාජ්‍යත්වයේ සංකේතය බවට පත්වේ. දළදා මාළිගාව හා බැඳී පවතින ඇසළ පෙරහැර මෙරට බෞද්ධ සංස්කෘතිය ආලෝකමත් කරන ප්‍රධාන අංගයකි. සෑම වසරකම ඇසළ මාසය එළඹෙත්ම බොදු ජන හදවත් තුළ නිතැතින්ම මතකයට එන්නේ මහනුවර දළදා පෙරහැරය. දළදා පෙරහැර හා සමානව දළදා වහන්සේ වැඩමවා යන හස්තියාද එම සතාගේ තේජාන්විත ගමන් විලාසය ද අවධානයට ලක්වන ප්‍රධාන අංගයයි.**

දළදාව වැඩම වන හස්ති රාජයාද දළදා වහන්සේ තරමට බොදු ජන සිත් තුළ ගෞරවාදරයට පාත්‍ර වීම පුද්මයක් නොවේ. ඒ නිසාම එම හස්තියා කෙරෙහි ජනතාව අතර නිරන්තර ගෞරව ඇගැයීම ප්‍රසාදය ඇති වෙයි.



මෙම ගෞරවය අඛන්ඩව දිනා සිටි දළදා මාළිගාවට ම අයත්ව සිටි රාජා ඇතාගෙන් පසු බොදු ජනයාගේ විශේෂ ගෞරවාදරයට පත්වූ විශිෂ්ට හස්ථියෙකු වූයේ **නැඳුන්ගමුවේ විජය රාජා හස්තිරාජයා**ය.

ඇසළ පෙරහැරේ සාමාජියෙකු වීමට හැම හස්ති රාජයෙකුටම හැකියාවක් නොමැත. පෙරහැර මංගල්‍යයේ පූජණීයම වස්තුව වන සධාතුක ධාතු කරඬුව වැඩමවා ගෙන යෑමේ උදාර ගෞරවය ලැබෙනුයේ ඒ අතරිනුත් එක් අයෙකුටය. එවන් හස්තියෙකුට තිබිය යුතු විශේෂ ලක්ෂණ ගණනාවක් ඇත. හත්පොල වැදුම් පිහිටා තිබිය යුතුය. එනම් භූමි ස්පර්ෂ ස්ථාන හතක් තිබිය යුතුය. එම ස්ථාන හත නම් හතර පා, හොඩවැල, ලිංගය හා වලිගයයි. එය අනිවාර්ය වේ. ඊට අමතරව පුලුල් පිටක් තිබිය යුතුය. පළල් වූ කුම්භස්තලය උදාර ලීලාව තේජාන්විත දළ යුගල තවද මනා කීකරු හස්තියෙකු විය යුතුය.

මෙවන් පූර්ව අංග ලක්‍ෂණයන්ගෙන් සමන්විත වූ නැඳුන්ගමුවේ විජය රාජාට පෙර තවත් හස්තීන් තිදෙනෙකු ජනතා ගෞරවාදරයට පත්වූවා පමණක් නොව ඔවුන් ගේ සිරුරු ද මරණයෙන් පසුව අදද දැක ගැනීමේ භාග්‍ය ජනයාට හිමි වී ඇත.

දළදා මාලිගාවට අයත් වූ රාජා එක් හස්තියෙකි. රාජාගේ සංරක්ෂිත සිරුර දළදා මාලිගාව අසලම කෞතුකාගාරයක තැන්පත් කර තිබේ. හෙයියන්තුඩුවේ රාජා එවැනිම තවත් එක් හස්තියෙකි. එම සත්වයාගේ සංරක්ෂිත අස්ථි කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත. ඉන් අනතුරුව මිලල්ගෙ ාඩ රාජා ඇතුගේ දළ යුගලයද සහිත සංරක්ෂිත අස්ති සැකිල්ල කෑගල්ලේ මොරගොඩ ප්‍රදේශයේ කෞතුකාගාරයක තැන්පත් කොට ඇත. එවන් උදාර තේජාන්විත ලීලාවෙන් යුත් කීකරු ඇත් පන්තියක වර්තමාන සාමාජිකයා වූයේ නැඳුන්ගමුවේ විජය රාජා හස්තියාය. එම හස්තියා මාර්තු 7 වනදා මෙළොවින් සමුගත්තේය.

විජරාජා සම්බන්ධයෙන් ඉතිහාසයක් පවතී. විජයරාජා හදිසියේ පහළ වූවෙකු නොවේ. ඒ 1950 තරම් ඈත කාලයේ සිදුවීමකි. ඉන්දියාවේ මයිසූර් ප්‍රාන්තයේ මහාරාජා කෙනෙකුගේ ඥාතියෙකුට සුවකළ නොහැකි උමතු රෝග යක් තිබුණි. එම රෝගය සුවපත් කිරීමට හැකිවූයේ නීලම්මහර වෙද හාමුදුරුවන්ටය.

7 වෙනි පිටුවට...

## සිතුවිලි දුරක

නිසලයි කාමරය සිතුවිලි දුරක දුවයි
රුවක සිතුවමක් හදවත පුරා ඇඳෙයි
මා හා ගැවසෙනා වාගේ සිතට දැනෙයි
ඒ හැමදේම තනිබව සංකේත කරයි

පාලුව තනිය මා වට කරගන්න කොට
හමනා සුළඟෙ සීතල මට දැනෙන කොට
ගත මගෙ ඔයාගේ උණුසුම සොයනකොට
ඉගිලි එන්න සිතෙනවා හැම නිමා කොට

සිතුවිලි වැටක් බැඳ ඇත මැදි කරලා තියා
නිතරම මගේ හද අහනව කොහෙද ඔයා
ඇස්දෙක මගේ අසරන වේ ඔබව සොයා
මම අසරනයි සිතුවිලි වැල් අතර මෙයා

ගේ ඉස්සරහා මිදුලේ අපි එකට සිට
මිමිනූ වදන් ඇහෙනව හදෙ සතුට පිට
ගී හඩ නගන කුරුලන් අපි දකින කොට
දැක්කද මයින ඉගිලූන හැටි අති බයට

ගස්ලබු ගහේ ගෙඩි හැදිලා තියෙනවද
පේර ගහේ ගෙඩි හැදිලා ඉදෙනවද
පිච්ච වැලේ මල් පිපිලා සුවඳයිද
කොහොඹ ගහේ සිසිලස දැන් දැනෙනවද



ඔබගේ සිනා මගෙ දෙසවන ඇලුම් කරයි
ඒ හඩ මගේ ගත සිත නිති පුබුදු කරයි
ඔබගේ සුවඳ මගෙ හදවත අවදි කරයි
කතා කරන ඇස් නිතරම හිතට නැගෙයි

සන්සුන් සිතින් දෙවිඳුන් වෙත ලංවෙන්න
ඒ මග යමින් ඒ සුවඳට එක්වන්න
ඔබෙ දිවි ගමන කිරි පැනියෙන්ඉතිරෙන්න
දෙවිඳුන් නමැද මම පතනව බැතියෙන්ය

අදහස් පතන හැම ඔබගේ ඉටුවේවා
ජීවන ගමන තුල හැමදේ සරුවේවා
යස ඉසුරින් ඔබෙ ජීවය ඉතිරේවා
දෙවිඳුන් නමැද පතනව ඔබ රැකදේවා

එස්.පී. ද සිල්වා - කැනඩාව

## පැරණි තේරවිලි

කොකෙක් සේම කඳ මැද්දෙන් බදාගෙන
මොනරෙක්සේම දස අත පිල් විදාගෙන
ගෙඩි කති කොළ නොකති කවුරුත් බෙදාගෙන
තෝරන් යාලු මේ තුන් පද අසාගෙන

පිළිතුර - පුවක් ගස

පිටතින් ගෙඩිය කෙදි ඇති සකි රළු නොමැති
නිතියෙන් ඇඹුල් රසැති ඇතුලේ ලොදය ඇති
පිළිකුන් පල බුදින විට පැණි වැගිර යති
මෙලෙසින් ඇති ගෙඩිය තොරනු මිතු නැණැති

රළුව නොමැති කෙදි යුතු ගෙඩි නම් මිතුර
බැලුව නෙතින් කියනව ඇත බොහෝ දුර
තළුව ගසා ලොදකන ලෙලි හැර නිතර
අනුව සකිය රඹුටන් ගෙඩි බව මෙවර




## කළු මතකය

පාලුව අඳුර දසතින් එයි ගලාගෙන
මගේ සුසුම් පවනක් සේ මා ලඟම
හදවත පෑරවූ සිතුවිලි විලක් මැද
අඳුරට දුකට ඉඩදෙමි සිත වෙලීමට

ඔබේ යාළුකම මට ආදරය වුණී
මට නොකියම බෝ දෑ ඔබ ළඟ තිබුණී
උපන් දිනේ ඔබ ඇර වෙන අය ඉද්දී
යන්න ඔබත් දුන්නේ කළු මතකයකි

**දනන්ජී සිල්වා**

6 වෙනි පිටුවෙන් ...

මෙම රෝගය සුවපත් කිරීම නිසා මහාරාජාවරු මහත් සේ සතුටට පත්ව වෙදහාමුදුරුවන්ව ඉන්දියාවට වැඩම කරන ලෙස ඉල්ලීමක් කළේය. වෙද හාමුදුරුවන් එම ඉල්ලීමට අනුව ඉන්දියාවට වැඩම කළේය. එම මහා රාජාට හිමි ඇත් පංතියක් ද විය. තුටු පඬුරු ලෙස යමක් ඉල්ලන මෙන් මහා රාජා කළ ඉල්ලීමට අනුව වෙද හාමුදුරුවෝ ඇත් පාටවුන් දෙදෙනෙකු ඉල්ලා සිටියහ. ඒ අනුව මහාරාජාගේ ඇත් පංතියේ සිටි ඇත් පැටව් දෙදෙනෙකු හාමුදුරුවන්ට ලැබුණි. එම ඇත් පැටව් දෙදෙනා නැව් මගින් ලංකාවට ගොඩ බටහ.

හාමුදුරුවන්ගේ පංසලේ මෙම සුරතලුන් දෙදෙනා කෙළිදෙළෙන් වයස අවුරුදු 15 ක් පමණ වනතුරු හැදී වැඩුනහ. තවදුරටත් මොවුන් රැකබලා ගැනීමට හාමුදුරුවන්ට හැකියාවක් නොතිබුණි.

ඉන් පසු හාමුදුරුවෝ ඇඹිලිපිටියේ සහ හොරණ ප්‍රදේශයේ ප්‍රභූන් දෙදෙනෙකුට මේ දෙදෙනා බාර කළේය. එම දෙදෙනා ලඟ තවත් වසර 10 ක් දිවි ගෙවීමෙන් අතුරුව 1978 දී පමණ හොරණ ප්‍රදේශයේ සිටි ඇත් පැටවා නැඳුම්ග මුවේ ලොකු වෙදරාලාහාමි විසින් රු. 75,000 කට මිලදී ගන්නා ලදී.

# නැඳුන්ගොමුවේ රාජා.....

ඇඹිලිපිටියේ සිටි ඇත් පැටවා කොළඹ ගංගාරාම විහාරස්ථානයේ පොඩි හාමුදුරුවෝ විසින් මිලදී ගන්නා ලදී. ඒ අනුව ගංගා රාමයට ගිය ඇත් පැටවා එතැන් සිට නවම් රාජා වශයෙන් නම් ලැබූ අතර නැඳුන්ගමුවට ගිය ඇත් පැටවා නැඳුම්ග මුවේ වලව්වේ විජය රාජා ලෙසින් නම් ලැබීය.

ගම්පහ දිස්ත්‍රික්කයේ



බැලුම්මහර හංදියෙන් හැරී බියගම පාරේ රතුපස්වලට නුදුරින් නැඳුන්ගමුව විදුහල්භූමිය පසුකරත්ම නැදුම්ගොමුව වෙද වලව්ව පිහිටා ඇත. විජය රාජාගේ වාසභූමිය වූයේ එම ස්ථානයයි.

නැදුම්ගොමුවේ රාජාව බලා ගැනීමට ඇත් ගොවුවන් සිවු දෙනෙකු කටයුතු කර ඇත. සීමන් අයියා සහ සෝමෙ අයියා ද වූ අතර අවසානයට ඔහු මිය යනතෙක්ම විල්සන් අයියා කටයුතු කළහ. විල්සන් අයියා ගේ සහයට ජයසිංහ හා අජිත් දෙදෙනා ද සිට ඇත.

නැදුන්ගොමුවේ රාජා පළමුවරට දළදා පෙරහැරට 2005 වසරේ සහභාගි වූ අතර ඔහු පළමු අවස්ථාවේ වාහල්කඩින් ඇතුල් වූයේ නැත. අනතුරුව දළදා හාමුදුරුවන්ට භාරහාර වී අටපිරිකර පූජාවක් තැබීමෙන් අනතුරුව රාජා වාහල්කඩින් ඇතුල් වී ඇත.

දළදා කරඬුව සහිත රන්සිවි ගෙය ඇතු පිට තැබීමට පෙර විශේෂයෙන් තනන ලද සමින් යුතු බඳ පටි වලින් උදරය වටා එතිය යුතුය. එහෙත් ඇතාගේ විශාලත්වය නිසා එසේ එතිය හැකි බඳ පටි නොතිබුණි. එබැවින් 2005 වසරේදී රාජාට කරඬුව වැඩම වීමට නොහැකි වුවත් පෙරහැරේ පෙරමුණේ ගමන් කිරීමේ භාග්‍ය උදා විය. ඊළග වසරේ එනම් 2006 දී නැඳුම්ගොමුවේ රාජා වෙනුවෙන් සම් බද පටි සකස් කර එම වසරේ සිට ධාතූන් වහන්සේ වැඩම කරවීම ආරම්භ විය.

එතැන් සිට වසර දහයකට අධික කාලයක් රාජා ධාතූන් වහන්සේ වැඩම කළේය. කිසි දිනක වාහනයක නො ගිය රාජා කිලෝමීටර් 190 ක් තරම් දුරකට පයින් ඇවිද යමින් ඇසළ පෙරහැර වෙනුවෙන් සිය දායකත්වය ලබා දුන්නේය.

සෑම වසරකම ඇසළ පෙරහැර වෙනුවෙන් නැඳුන් ගොමුවේ සිට මහනුවර බලා පයින්ම ගමන් කරන රාජා පෙරහැර මංගල්‍යය අවසන් කර නැවතත් සිය වාසභවනය වෙත පයින්ම ඒම පුරුද්දක් කරගෙන සිටියේය. ඒ එන මඟ දෙපස දහස් ගනන් ජනයාගේ ගෞරවාදරයට ලක්වූ මේ හස්තියා අවට වාසීන්ගෙන් නිරන්තරව ලැබෙන රසවත් ආහාර භුක්ති විදිමින් ඉතා සතුටින් කිසිවිටක කිසිවෙකුට අතුරු ආන්තරාවක් සිදු නොකර ගමන නිමා කිරීමට තරම් විනීත බවක් රාජා තුළින් දක්නට තිබුණි.

2016 වසරේදී පෙරහැර බලා යන අතර තුර අවිනීත බස් රියැදුරෙකු විසින් අශීලාචාරව පදවන ලද බසයක හැප්පී ඇතා ඇද වැටුනේය. නැවත නැගිටි හස්තියා ඉතා සංයමයෙන් ඇවිද ගියා මිස කිසිවෙකුට කිසිවකට හානියක් සිදු නොකළේය. අනතුරුව රජය මගින් රාජ්‍ය ආරක්ෂාව ඇතාට ලබා දුන් අතර ඉන්පසු ඇතා ගමන් කළේ පරිවාර හමුදා කාණ්ඩයක්ද සමග තේජාන්විත උදාර ලීලාවෙනි. ඇතාට හැමවිටම ජනයාගෙන් රසමුසු ආහාර වලින් අඩුවක් නොවීය. ඇතාද එම පරිත්‍යාග ඉතා සෙනහසින් බාරගත් අතර මෙරට ජනයා හා ඇතා අතර අන්‍යෝන්‍ය බැඳීමක් ද පැවතුනි.

අඩි 10 අඟල් 6 උසින් යුතු මෙම තේජාන්විත හස්තියා මිය යන විට ආසියාවේ හීලෑ දළ ඇතුන් අතර ප්‍රමුඛයා විය. එම වාර්තාව ඉන් පෙර මිල්ලන්ගොඩ ඇතාට ද හිමිව තිබුණි. අඩි පහකට වඩා දිගින් යුතු දළ යුවළක් තිබූ අතර පළල් වූ කුම්භස්තලයත් අඩි 10 වැඩි උසත් විසින් මෙම හස්තියා ගරු ගාම්භීර පෙනුමකින් සන්නද්ධ කළේය.

මෙරට බොහෝ දෙනෙකුගේ ආදරයට ගෞරවයට පාත්‍රවීමට තිරිසන් සත්වයෙකු වුවත් රාජා වාසනාවන්තයෙකු බවට පත්විය. ජාතික වස්තුවක් බවට පත්වූ හස්තියා ගේ දේහය සංරක්ෂණය කොට ඉදිරි පරපුරට දැක බලා ගැනීම සඳහා මේ වන විට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ඇත. ඉදිරි කාලයේදී හස්තියාගේ සිරුර දැක ගැනීමට මෙරට වාසීන්ට ඉඩ හසර ලැබෙනු ඇත.

තිරිසන් සත්වයෙකු වුවත් සෙසු සතුන්ට වඩා පුණ්‍ය බලයක් තිබූ වාසනාවන්තයෙකු බව පැහැදිළිය. වසර 68 ක තරම් කාලයක් දිවි ගෙවා දස වසරකට අධික කාලයක් සදාතුක ධාතූන් වහන්සේ වැඩම කරවීමේ භාග්‍ය ලබාගත් නැඳුන්ග මුවේ ඇත් රජුට මොක්සුව ප්‍රාර්ථනා කරමු.

# කෙනෙක් අකමැති කෙනෙක් කැමති දූරියන්



මේ දිනවල ඉතා සුලභ ලෙසින් දක්නට ලැබෙන දූරියන් ඔබට නුහුරු පළතුරක් නොවේ. ඇතමුන්ට මිහිරි පලතුරක් ලෙසින්ද තවත් අයෙකුට අප්‍රිය දුර්ගන්ධය නිසා ඉවසිය නොහැකි අප්‍රසන්නත්වයක් ඇති කරන දූරියන් බොම්බෙකාසියේ කුලයට අයත් වේ. උද්භිද විද්‍යාත්මන නාමය - Durio Zibethinus යන නාමයෙන් හඳුනවනු ලැබේ.

ශ්‍රී ලංකාවට මෙම පළතුර බුරුමයෙන් ලැබුණු අතර එරට උච්චාරනය අනුව ටූරියන් යන්න පසුකාලීනව දූරියන් ලෙසින් ව්‍යවහාරව ඇත. නිවර්තන කලාපයන්හි මෙම ශාකයේ වර්ධනයට අවශ්‍ය හිතකර දේශගුණයක් පවතී මිශ්‍ර තෙත පස වගාවට යෝග්‍ය අතර අධික ශීතල දේශගුණය වගාවට හිතකර නොවේ.

දූරියන් ගෙඩියක් කිලෝ ග්‍රෑම් තුනක පමණ බරකින් යුක්තය. පිටත ආවරණය සෙ.මී. 2 ක් පමණ වේ. තියුණු කටු නිසා ඇතුළත මාංසලයට හානියක් සිදු නොවේ. සුදු පැහැති මදුලු ගතියෙන් යුක්ත අතර එක් කාමරයක මදුලු දෙක තුනක් පමණ ඇති අතර ඇට එම මදුලු ඇතුළත ඇත.

**දූරියන් වල පෝෂණ සංයුතිය - ග්‍රෑම් 100 ක**

| | |
|---|---|
| ජලය | ග්‍රෑම් 58 |
| ශක්තිය | කැලරි 183 |
| ජීරණ තන්තු | ග්‍රෑම් 3.8 |
| ප්‍රෝටීන | මිලි ග්‍රෑම් 2.8 |
| මේද | ග්‍රෑම් 3.9 |
| කාබෝහයිඩ්‍රේට් | ග්‍රෑම් 34.1 |
| කැල්සියම් | මිලි ග්‍රෑම් 10 |
| පොස්පරස් | මිලි ග්‍රෑම් 50 |
| යකඩ | මිලි ග්‍රෑම් 1 |



**අස්ථි නිරෝගීභාවයට....**

දූරියන් මගින් අපේ සිරුරට අවශ්‍ය පොටෑසියම් ප්‍රමාණය 9% ක් සපුරණ නිසා අස්ථිවල නිරෝගීතාවය පවත්වා ගැනීමට මෙම පළතුර ඉතා ගුණදායකය.

ඒ වගේම සැපදායක නින්දක් වෙනුවෙන් අවශ්‍ය Serotonin සහ Melatonin වැනි ස්නායු රසායනයන් නිදහස් කරනු ලැබේ. ප්‍රමාණවත් නින්දක් මගින් ඔබේ මානසික වෙහෙස දුරු කරන අතර දවසට ප්‍රාණවත් හැඟීමක් ලබා දීමට සමත්ය. ඒ වගේම මෙහි අන්තර්ගත තන්තු නිසා ජීර්ණ ක්‍රියාවලිය පහසු කිරීම පමණක් නොව මළබද්ධය දුරු කරන බවටත් අධ්‍යයනයන් මගින් හඳුනාගෙන තිබේ.

**කාම ශක්තියට...**

ඉදුනු දූරියන් ඇට ව්‍යාංජනයක් ලෙස සහ පානයක් ලෙස යොදා ගැනීමෙන් වාජීකරණ ශක්තිය උත්තේජනය වේ. මෙම ඇට රාත්‍රියේ ඇල්දියේ බහා තබා පසුදින පානය කිරීමෙන් පුරුෂ භක්තිය උත්තේජනය වේ. මෙම පානය මුත්‍ර රෝගයන්ටද ගුණ දායක වේ. ඒ වගේම ගර්භනීත්ව සමයේ ඇති වෙන රක්ත හීනතාවයටත් දූරියන් ගුණදායක වේ.

වියපත් වීම සමග ඇති වෙන සම රැළි වැටීම්, ලප පැල්ලම් ඇති වීම, හිසකෙස් වැටීම සහ දන්ත සෞඛ්‍ය පිළිබඳ ගැටලුවලට පිළිතුරු ලබා දෙන දූරියන් අපේ වයස්ගත පෙනුම මෙන්ම ඒ සමග ඇති වෙන ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය පවා පාලනය කිරීමට සමත් පළතුරකි.

**මද්‍යසාර හෝ කෝපි සමග පානය එපා....**

දූරියන් සමග කෝපි සහ මද්‍යසාර පානය කිරීමෙන් වළකින ලෙසට වෛද්‍යවරු නිර්දේශ කර ඇත. මෙම පලතුරේ ඉහළ සල්ෆර් සංයුතියක් අන්තර්ගත නිසා සිරුරේ විෂ නැසීමේ ශක්තිය දුර්වල කරන බව අධ්‍යයනයකින් පෙන්වා දී ඇත.

දූරියන් පළතුර වෙතින් වහනය වෙන අපුල ගන්ධය පළතුරු රස දන්නා අයට මිහිරි වුණත් රස නොදන්නා අයට පිළිකුල් සහිත බව සඳහන් කරයි.

**දූරියන් වල ඇත් ඖෂධීය ගුණ**

- අස්ථි හා දත් ශක්තිමත් කරයි.
- රක්තහීනතාවයට ගුණදායකය.
- දියවැඩියා රෝගීන්ට ගුණදායක වේ.
- අධි රුධිර පීඩනය සමනය කරයි.
- මලබද්ධය සමනය කරයි.
- හෘද රෝගීන්ට ගුණදායකය.
- සුව නින්දක් ලබා ගත හැකිය.
- මතක ශක්තිය වර්ධනය කරයි.
- ඔසප් වේදනාවෙන් සමනය කරයි.
- පිළිකා ඇතිවීම වළක්වයි.
- මානසික ආතතිය විශාදය සමනය කරයි.
- සමෙහි හටගන්නා දද. කුෂ්ට රෝග සඳහා ගුණදායකය.
- හිසරදය හා උණ රෝගීන්ට ගුණදායකය.
- ලිංගික ශක්තිය වර්ධනය කරයි
- කුඩා ළමුන්ට ඇති පනු රෝග වලටද ගුණදායී වේ.
- ශරීරයේ ඇතිවන වේදනාවන් හා ඉදිමුමට ගුණදායකය.
- රුධිරය පිරිසිදු කරයි.
- ඉරුවාරදයට භාවිතා කළ හැකිය
- සම පැහැපත් කරයි හිසකෙස් වර්ධනය කරයි.



**දූරියන් ආහාරයට නුසුදුසු අවස්ථාද ඇත. ඒ ගැන සැලකිලිමත් විය යුතුයි.**

- ඇදුම හෝ සෙම්ප්‍රතිශ්‍යාව ඇති රෝගීන්ට දූරියන් ආහාරයට ගැනීම සුදුසු නොවේ.
- ගර්භණී මව්වරුන්ද දූරියන් වැඩි වශයෙන් ආහාරයට ගැනීම නුසුදුසුය.

අප රටෙහි කහ පැහැති මාංසලය සහිත දූරියන් ද වෙනත් රටවල රතු, තැඹිලි මාංසලයකින් යුතු දූරියන් ද දැක ගත හැකිය.

මෙවැනි බොහෝ රෝග සමනයට හේතුවන මෙවැනි ගුණදායක පළතුරු කලාතුරකින් හෝ ආහාරයට ගැනීමට ඔබත් අමතක නොකරන්න.

# නොනවතින අරගල







අප්‍රේල් 4 වන දා සිට ගාලු මුවදොර ආරම්භ කළ අරගලය තවත් එසේමය. විවිධ වූ අසහනයන්ට සහනයක් උදෙසා ආරම්භ කළ මෙම අරගලය විවිධ පිරිස් යටි අරමුණු ඔස්සේ එක්වූහ. ඔවුන් ගේ අරගලය අසහනයට පත් වූවන්ට සහනයක් ලබා දීම නොව තම අරමුණු ඉටුකර ගැනීමයි. අරගලය ආරම්භ වූයේ ජනාධිපති ගෝඨාභය ගෙදර යන ලෙස බලකරමිනි. ඔහු ජූලි 9 වන දා රටින්ද පිටවිය. එහෙත් අරගලය ලාමක වශයෙන් එළෙසම පවතී.

අරගලකරුවෝ ජනාධිපති මන්දිරයට ජනාධිපති ලේකම් කාර්යාලයට හා අරලිය ගහ මන්දිරයටත් පසුදා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයටත් ඇතුල් වූහ. මෙසේ ඇතුල් වූ දහස් ගනන් පිරිස් නිසා එය විනාශ විය. ජනාධිපති කොඩිය ඇදට එලාගෙන එකෙකු නිදාගත්තේය. එහි වැටවල් කඩා ගෙන සමහරු ගෙදර ගෙන කියහ. තවත් අය නානා තටාකයේ නෑහ. තවත් අය කුස්සියේ ඉවුම් පිහුම් කළා පමණක් නොව එහි බඩු භාණ්ඩ වලට අලාභ හානිද සිදු කළහ. වඳුරන් අලින් රිලවුන් නිවෙස් තුළට ඇතුල් වූ විට සිදුවන අලාභයට හා සමාන අලාභයක් ඉහත කී රාජ්‍ය ආයතන තුළ දක්නට ලැබෙති.

මේවා මහජන දේපල බව ඔවුන්ට වැටහෙන්නට නැතුව ඇත. වෛරය ඊර්ෂ්‍යාව ක්‍රෝධය හීනමානය මේ කියන දුර්ගුන සියල්ල ඔවුන් තුළින් පිලිබිඹු විය.

ඒවා නැවත යථා තත්ත්වයට පත්කිරීම සඳහා අතිවිශාල මහජන ධනස්කන්දයක් වැය කිරීමට සිදුවනු ඇත. එදාවේල කන්න නැති රටකට සිදුවූ මේ පාඩුවද කුසගින්නේ සිටින ජනයා ගේ බත් පතෙන් අඩු වන බව නම් ඉතා පැහැදිලිය.

අරගලය ඉලක්ක කළ කරුණ වූයේ ජනාධිපති ගේ ඉවත්වීමයි. ඔහුගේ ඉවත් වීමෙන් පසු මේ විනාශය රටට සිදුකළේ කුමන හේතුවක් නිසාද යන්න අරගලකරුවන් පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකි.

මෙම කාලය තුළ පාරවල් අවහිරකරමින් මහජනතාවගේ සිත් නොසන්සුන් කරමින් පැවතුන ආර්ථික මට්ටම හෝ පහත හෙළමින් රාජ්‍ය පරිපාලනය අකර්මනය කරමින් රටට සිදුකළ පාඩුව වෙනුවෙන් වූ වන්දිය ද අත්කර ගත යුත්තේ අරගලයට සහාය වූ හා නොවූ සියලු පොදු ජනයාගේ බත් පතිනි.

හිස නැති ක්වන්දයක් මෙන් වැනුනු අරගලයට නිශ්චිත නායකත්වයක් නොතිබුණි. ඔවුන් යන ඉලක්කයක්ද නොතිබුණි. කෙසේ නමුත් කුමන හේතුවක් නිසා හෝ ඔවුන්ගේ අරගලය වූයේ ගෝඨාභයට යන්න කියන එකය. ඔවුන්ගේ වෛරය හා ඔවුන්ගේ අවශ්‍යතාව තිබුණේ ගෝඨා පළවා හැරීමය. දැන් එය ඉටුවී ඇත. අරමුණ ඉටු වූ පසු අරගලය නැවැත්විය යුතුය.

කෙසේ නමුත් ලාංකික ජනතාවද විචාර බුද්ධියෙන් තොර පිරිසකි. සුලු පිරිසක් වූ අරගල කරුවන්ගේ ජන ගංගාව වැඩි වූයේ මේ අවිචාරවත් පිරිස හේතුවෙනි. ඔවුන් අරගල භූමියට ගොස් සංගීත සාද පැවැත්වූහ. ජනතාව විනෝද වූහ. විශාල පිරිසක් අරගලයට එකතු වූයේ විනෝදාස්වාදය සඳහාය. අරගලයට ගොස් සෙල්පියක් ගසා මුහුණු පොතෝ නොදැම්මොත් එය අඩුවක් යන මානසිකත්වය තරුණ සමාජයට තුළ ගොඩ නැගූහ. අරගලයට නො ගිය ප්‍රසිද්ධ කලාකරුවන් ජාතික වැඩ සටහනකින් පලා ගිය අශීලාචාර පිරිසක් බවට ජන මතයක් හැදූ බැවින් ප්‍රසිද්ධ කලාකරුවන්ට අරගලයට නොගිහින් සිටීමට නොහැකි වූහ. ලංකාවේ ප්‍රවීණ කලාකරුවන් අරගල භූමියට ගොස් අරගලයට ආශිර්වාද කර එහි ජයග්‍රහණය ප්‍රාර්ථනා කර මාධ්‍යයට මුහුණ පෙන්නා නිවෙස්වල සිටි පිරිස්ද අරගලයට එක් කිරීමට අවශ්‍ය ධෛර්ය ගොඩ නගා අරගලයට උරදුන්නන් ලෙස සිය මෙහෙවර ඉටුකළේය. විවිධ ව්‍යාපාරිකයින් අරගල කරුවන් වෙනුවෙන් දන්සැල් පැවැත්වූහ. වතුර බෝතල් ලබා දුන්හ. නීතිඥ සංගමය නීති සහාය නොමිලේ ලබාදුන්හ. වෛද්‍යවරු අරගලය වෙනුවෙන් නොමිලේ සේවා සැපයූහ. වාහන හිමිකරුවන් ප්‍රවාහන පහසුකම් සැපයූහ. අරගලයට එකතු වන්නට යන වුන් කෑම බීම හැකි අයුරින් උපයා සපයා ගෙන ගියහ. මේ නන් විධ පිරිස් විසින් ලබා දුන් සහයෙන් අවසන් ප්‍රතිඵලය වූයේ 69 ලක්ෂයක් ජන්දය ලබා ජනාධිපති වූ නායකයා පලවා හැර 22,000 ක් ජන්දය ලබාගත් පුද්ගලයා ජනාධිපති කිරීම හා රුපියල් කෝටි ගණනක රාජ්‍ය දේපළ විනාශ කිරීමය. ඊටත් අමතරව කෞතුක වශයෙන් වටිනා මිළ කළ නොහැකි වස්තුව රටට අහිමි වීමය. අනියම් වශයෙන් රාජ්‍ය පරිපාලනය බිද වැටීමත් මානසික අසහනයේ සීමාවත් මිල කළ නොහැක.

ගෝඨාභය ජනාධිපති රටින් පලාගිය දවසේ රාත්‍රී එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ නිවසට අරගලකරුවන් ගිනිතබා විනාශ කළහ. ඒ වන විට එම නිවස හා එහි පොත් දේපළ රාජකීය විද්‍යාලයට හා විශ්ව විද්‍යාලයට ලියා තිබූ වටිනා වස්තූන්ය. අරගල කරුවන් තම වෛරය පිරිමසා ගත්තේ මෙවැනි වටිනා දේ විනාහ කිරීමෙනි. මේ සියලු කටයුතු සඳහා විද්‍යුත් ජනමාධ්‍ය ඇතුලු උගත් බුද්ධිමත් කියා ගන්නා පිරිස්ද දේශපාලන විවිධ මත දරන්නන්ද බොහෝ පොදු ජනයාද ඇතුලුව විචාර බුද්ධියකින් තොරව අරගලයට ආශිර්වාද කළ සියල්ලෝ මේ අපරාධයට නියමින් හෝ අනිමින් සම්බන්ධ හා අනුබල දුන් පිරිස්ය.

ජනාධිපති රටින් පලා ගොස් විශාල විනාශයක් සිදුවූවාට පසු නීතිඥ සංගමය ප්‍රකාශ කළේ මෙතනින් එහාට ව්‍යවස්ථාවට අනුව කටයුතු සිදුවිය යුතු බවය. ඔවුහු නීතිය පිළිබඳ හසල දැනුමක් ලද්දොද් වෙති..

ඒ අනුව ව්‍යවස්ථාවට අනුව අගමැති රනිල් ජනාධිපති විය. රාජ්‍ය ආයතන බලෙන් අල්ලා සිටි පිරිසට නීතියට අනුකූලව පහර දී එළවා දැමීය. අරගල භූමියෙන් විවිධ සංවිධාන එකින් එක ඉවත් විය ලැජ්ජාව දරාගත නොහැකි සුලු පිරිසක් තාමත් ගාලු මුවදොර පිටියේ රැදී සිටිති.

ඊළගට කළ හැක්කේ රාජ්‍ය සේවකයින්ට සුපුරුදු වර්ජනයක් දියත් කොට රාජ්‍ය අකර්මන්‍ය කිරීමය. ඒ සඳහා දැන් ඔවුන් ටික ටික පාරම්බාති. තෙල් පෝලිම් ගෑස් පෝලිම් විදුලිය බිද වැටීම භාණ්ඩ හිගය උද්ධමනය ආර්ථික දරිද්‍රතාව ය තාමත් එලෙසම පවතී. මෙම ප්‍රහ්න වලට අරගල හා වර්ජන වලින් විසදුම් නොලැබෙනවා පමණක් නොව ඒවා තවදුරටත් වැඩිවන බව කවුරුත් දන්නා කරුණකි. සමහර අන්තවාදී හා ෆැසිස්ට් වාදී අදහස් දරන්නන්ගේ අපේක්ෂාව රාජ්‍ය බිද වට්ටා බලය ලබා ගැනීමය. මේ ඒ සඳහා කරන අරගලයක් දැයි සැක සහිතය.

කෙසේ නමුත් මෙම අරගලය තුළ නොපෙනෙන බලවේග ක්‍රියාත්මක වූ බව දන්නෝ දනිති. අරගලය රටේ යහපත උදෙසා කළ දෙයක් නම් ඔවුන්ට රාජ්‍ය නායකයා පළවා හැරීම, රාජ්‍ය දේපොළ විනාශ කිරීම නිවාස දේපල ගිනි තැබීම අවශ්‍ය නැත. රටේ යාහපත වෙනුවෙන් ඔවුන්ගේ යෝජනා රජය මගින් බලහත්කාරයෙන් හෝ ඉටුකර ගත යුතුව තිබුණි. පැන නැගුන ආර්ථික අර්බුධය වෙනත් මාර්ගයකට යොමුකළා විනා අර්බුධයට පිළියම් යෙදීමට අරගලයට නොහැකි වූවා පමණක් නොව අර්බුධය දිග්ගැස්සීමත් ඉන් සිදුවිනි.


CEYLON SHIPPING LINES LTD
SPECIAL RATES ON COURIER PACKAGES
WE HAVE SPECIAL RATES FOR BELOW COUNTRIES
AUSTRALIA
GERMANY
CANADA
UK
USA
GEORGIA
NEW ZEALAND
BELGIUM
SPAIN
Ceylon Shipping Lines LTD
No. 450, D. R. Wijewardena
Mawatha,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Call us now for the attractive rates,
M :- 0772672970
0773572835
0773561210
E :- csltravels@sltnet.lk





# අපේ අර්ජුන සමග හැප්පුනු ෂේන් වෝන් ජීවිතයෙන් සමුගනී.

**ඕස්ට්‍රේලියාවේ ප්‍රවීන ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ ෂේන් වෝන් ගැන ලොව පුරා සිටින ක්‍රිකට් ලෝලීන් නොදන්නවා යැයි සිතිය හැකි නොවේ. ඒ තරමටම ඔහු ලෝක පිතිකරුවන් සිය පන්දුවෙන් දන ගැස්සුවේය. ෂේන් දෙවැනි වන්නේ අපේ මුරලිට පමණී.**

1969 සැප්තැම්බර් 13 ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා හිදී උපත ලබන ෂේන් ගේ නම ෂේන් කීත් වෝන්ය. ඔහු උපතින්ම හෙටරෝක්‍රෝමියා තත්ත්වයෙන් පසුවන දරුවෙකු විය. ඔහුගේ දකුණු ඇස නිල් පැහැයෙන්ද වම් ඇස කොළ පැහැයෙන්ද යුක්තය.

1992 දී ඕස්ට්‍රේලියාවේ සිඩ්නි ක්‍රීඩා පිටියේදී ඉන්දියාව සමග පැවති ටෙස්ට් තරඟයට සහභාගි වී ඉන්දීය පිතිකරු ශාස්ත්‍රී ලකුණු 206 ට දවා ගනිමින් පළමු ටෙස්ට් කඩුල්ල ලබාගත් ෂේන් 2007 දී එම පිටියේදීම එංගලන්තය සමග අළුබඳුන ටෙස්ට් තරගාවලියට සහභාගි වී අවසන් තරඟයේදී එංගලන්තයේ ක්‍රිකට් නායක ඇන්ඩෲ ෆ්ලින්ටොෆ් දවා ගත්තේ තම ජීවිතයේ අවසන් ටෙස්ට් තරඟය වූ 145 වන තරඟයේදී පුරා වසර 15 ක ටෙස්ට් ජීවිතය 708 වන කඩුල්ල වශයෙනි. එම කඩුල්ල දිනා ගැනීමත් සමග ඒ වන විට ලොව වැඩිම කඩුලු ලාභියා ගේ වාර්තාව ඔහුට එක්විය. (එයින් මාස කීපයක් ගතවෙත්ම ෂේන් අත තිබූ කඩුලු වාර්තාව ලංකාවේ මුත්තයියා මුරලිදරන් අතට පත්විය.) එදා ඔහු සිය අවසන් ටෙස්ට් තරඟය අවසන් කොට පනස් දාහකට අධික ප්‍රේක්ෂක පිරිස වෙත අත ඔසවා පිටිය වටා රවුමක් යමින් සමස්ත ලෝක වාසී ක්‍රිකට් ප්‍රේක්ෂකයන් වෙනුවෙන් සමුදුන්නේය. එදා එම ප්‍රේක්ෂකාගාරයේ බොහෝ පිරිසකගේ නෙතඟ කඳුලින් තෙත් විය.

ෂේන් වෝන් හා ශ්‍රී ලංකා ක්‍රිකට් පිලටද ශ්‍රී ලංකා ක්‍රිකට් ලෝලීන්ටද අමතක නොවන අමතක කළ නොහැකි තරඟයක් 1992 දී අගෝස්තුවේ දී පැවැත්විනි.



කොළඹ එස්.එස්.සී. පිටියේදී පැවැති ටෙස්ට් තරගය අති විශේෂ විය. පළමු ඉණිම ක්‍රීඩා කළ ඕස්ට්‍රේලියාව ලකුණු 256 ට දැවී ගියේය. දෙවනුව ක්‍රීඩා කළ ශ්‍රී ලංකා පිල පළමු ඉණිමට ලකුණු 574 ක් ලබා ගත්තේය. අසංක ගුරුසිංහ ලකුණු 137 කි. නායක අර්ජුන රණතුංග ලකුණු 127 ක් ද රොමේෂ් කලුවිතාරණ ගේ සිය මංගල ටෙස්ට් තරගය වූ එය නොදැවී ලකුණු 132 ක් විය. තරඟයේ ජය ලංකාවට නිතැතින්ම ලැබෙන බවට ලකුණු ඕනෑවටත් වඩා පහළ වී තිබුණි. පසුදින රටට නිවාඩුවක් ලබාදීමට ක්‍රීඩා ඇමති සැදී පැහැදී සිටියේය. පස්වන දිනය වන විට ලකුණු 40 ටත් අඩු සංඛ්‍යාවක් ලබාග ැනීමට තිබුණේ කඩුලු තුනක් ශ්‍රී ලංකාව අත තිබිය දීය. ඕස්ටේලියානු නායක ඇලන් බෝඩර් පන්දුව දුන්නේ ෂේන් වෝන් අතටය. එකවර ක්‍රියාත්මක වූ ඔහු පන්දුවාර කීපයක් දැමීය. එම පන්දුවාර තුළ එකම ලකුණක් හෝ නොදුන් ඔහු පරාජය වීමට ලකුණු 16 ක්ව තිබිය දී ජයග්‍රහණය ඕස්ට්‍රේලියාවට උදුරා දුන්නේ මොහුය.

ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ රංජිත් මධුරසිංහ හා දොන් අනුර සිරි ඔහු අතින් පරාජයට පත්වීමත් සමග ශ්‍රී ලංකාව ලකුණු 16 ට එම ටෙස්ට් තරඟය පරාජයට පත්විය.



ෂේන් වෝන් ගැන ලාංකීය ක්‍රිකට් ලෝලීන් එතරම් ප්‍රසාදයක් දැක්වූයේ නැත. පියා ඕස්ට්‍රේලියානු ජාතිකයෙකු වූ අතර මව ජර්මානු ජාතික කාන්තාවක වූවාය.

1984 දී ඔහු ඩව්නින් පළිහ සඳහා වන වයස අවුරුදු 16 න් පහළ වික්ටෝරියානු විශ්ව විද්‍යාල පිළ නියෝජනය කළේය. පා දග පන්දු හා පිට දග පන්දු යන දෙකම සම්මිශ්‍රණය වූ පන්දු රටාවක් යවන්නෙකු ලෙස ඔහු ජනප්‍රිය විය.

1992 පළමුවරට ඕස්ට්‍රේලියානු ජාතික කණ්ඩායමට එක්වූ ෂේන් වෝන් 1994 දක්වා කණ්ඩායමේ පිට පොල්ලේ එල්ලී එහෙන් මෙහෙන් ජාම බේරාගෙන රැඳී සිටි අයෙකු විය. 1996 ලෝක කුසලාන තරගාවලිය වන විට ඕස්ට්‍රේලියාවට නැතුවම බැරි අයෙකු මෙන්ම නායක මාක් ටේලර් ගේ තුරුම්පු ආසියා බවට පත්ව සිටියේ ඔහුය. මේ වන විට ලංකාවේ මුරලි හා ෂේන් වෝන් අතර කඩුලු ඩැහැ ගැනීම වෙනුවෙන් සීතල යුද්ධයක් පැවතුනි. එහි දී ඕස්ට්‍රේලියානු මෙන්ම බටහිර විනිසුරුවරුන් පවා ඕස්ටේලියාවට පක්ෂපාතීව කටයුතු කළේය. මුරලිට නොයෙක් පීඩාවන් සිදු කළේය.

ඕස්ටේලියානු පිලේ නායකයෙකු වූ ඉයන් චැපල් 1996 වන විට විස්තර විචාරකයෙකු විය. 1996 තරඟාවලියක දී විස්තර විචාර අට්ටාලයේ දී අර්ජුන ඔහු සමග කතා කොට එන විට ෂේන් වොන් චැපල් ගෙන් ඇසුවේ "අරූ මොනවද කියන්නේ" යනුවෙනි. 1996 වන විට ලංකා පිල ප්‍රබල තත්ත්වයක සිටියහ. ෂේන් වෝන්ගේ දඟ පන්දු අපේ පිතිකරුවෝ මායිම් කළේවත් නැත. ලංකාව සමග තරඟවලදී ෂේන් වෝන් අසාර්ථක පන්දු යවන්නෙකු බවට පත්විය. ෂේන් ගේ පන්දුවකට ඔහුගේම හිසේ ගෑවී නොගෑ වී යන ලෙස හතරේ පහරක් එල්ල කළ අර්ජුන වෝන්ට දිව දික්කර ඔච්චමක් ද කළේය. වරක් ෂේන් ජාත්‍යන්තර ටයිම්ස් සගරාවට ප්‍රකාශ කළේ තමාට අර්ජුන සමග මතබේද පවතින බවයි.

කෙසේ නමුත් ෂේන් වෝන් ඕස්ට්‍රේලියාවට ජාතික වීරයෙකු විය. ඔහු ජීවත්ව සිටිය දී ඔහු වෙනුවෙන් පිළිමයක් නිරාවරණය කිරීමට ඕස්ට්‍රේලියානු ක්‍රිකට් බලධාරීන් කටයුතු කළේ එබැවිනි. ඔස්ට්‍රේලියානු ක්‍රිකට් තුළ ඔහු බලය අල්ලා ගෙන සිටියේය. ඔහු හැම විටම දඩබ්බරයෙකු විය.

දුම්පානයටත් බියර් පානයටත් දැඩිව ඇබ්බැහි වී සිටි බව ප්‍රකට ය.

12 වෙනි පිටුවට....

11 වෙනි පිටුවෙන්....

# ෂේන් වෝන් ...

වරක් ඔහුට තහනම් උත්තේජක භාවිතා කළ බවටද චෝදනා එල්ල විය. ඉන්දීය ක්‍රිකට් ඔට්ටු අල්ලන්නෙකුගෙන් අල්ලස් ලබාගත් බවටද ඔහුට චෝදනා එල්ල විය.

බරපතල ලෙස රෝගාතුර වූ හා අඩු වරප්‍රසාද ලත් දරුවන්ට උපකාර කිරීමේ අරමුණින් ෂේන් වෝන් නමින් පුණ්‍යායතනයක් ලියාපදිංචි කිරීමට ඔහු 2004 දී කටයුතු කළේය. සංවිධානය ආරම්භයේ දී ලෝක ප්‍රකට බිලියනපතියෙකු වන ඩේම්ස් පැකර් ද එක්විය. පසුකලදී අභ්‍යන්තර ගැටුම් ඇතිවූ අතර 2016 දී එය අවසන් විය.

1995 දී ෂේන් වෝන් සිමොනේ කොලනන් සමග විවාහ විය. එය 2005 දී දික්කසාදයෙන් අවසන් විය. ඉන් දෙවසරකට පසු මාධ්‍ය වාර්තා කළේ ෂේන් වෝන් ඇය සමග නැවතත් විවාහ වන්නට යන බවය. එම වාර්තාව පලවී පස් මසකින් ෂේන් වෝන් ඇයට කෙටි පනිවිඩයක් යවා තිබුණි. මම වෙනත් කාන්තාවක් හා විවාහ ගිවිසගෙන සිටිනවා යනුවෙනි. එය එතනින් අවසන් විය.

අනතුරුව ෂේන් වෝන් බ්‍රිතාන්‍ය ජාතික රංගන ශිල්පිණියෙකු වූ එළිසබත් හාර්ෂල් සමග ප්‍රේමයක් ගොඩනගා ගත්තේය. පසුව හාර්ෂල් ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියාහි ෂේන් නිවසට පැමිණ නැවතිනි. ඒ 2011 වසරේදීය. 2013 වසරේදී විවාහ ගිවිසුම



වරක් ඔහුට තහනම් උත්තේජක භාවිතා කළ බවටද චෝදනා එල්ල විය. ඉන්දීය ක්‍රිකට් ඔට්ටු අල්ලන්නෙකුගෙන් අල්ලස් ලබාගත් බවටද ඔහුට චෝදනා එල්ල විය.

අතහැර දෙදෙනා වෙන් විය. ඒ ගැන ඔහු මෙසේ කීය. "මම තේරුම් ගෙන සිටියාට වඩා මම එළිසබෙත්ට ආදරය කළා ඇය සමග සිටි දෙවසර මගේ ජීවිතයේ ප්‍රීතිමත්ම කාලයයි. ඒ ආදරය මට මඟ හැරී ගියා" යනුවෙනි.

1999 ක්‍රිකට් කණ්ඩායමේ උපනායකයා වූ ඔහුට එම තනතුර අහිමි වූයේ ඉංග්‍රීසි ජාතික හෙදියකගේ ජංගම දුරකථනයකට අසභ්‍ය කෙටි පනිවිඩ යැවීම හේතුවෙනි. නවසීලන්ත ජාතික නිරූපිකාවක වන කොරලියා සමග ලිංගික සබධතා පැවැත්වූ බවද ඔහුට චෝදනා එල්ල විය. ස්ත්‍රී ලෝලිත්වය පිළිබඳව ෂේන්ට නොයෙක් වර චෝදනා එල්ල වුවත් ඔහු එය ගණනකට ගත්තේ නැත.

අවසානයේදී පසුගියදා ෂේන් වෝන් තායිලන්තයේ මිය ගියේද ස්පා ආයතනයක සේවය ලබා ගැනීමෙන් අනතුරුවය. ඔහුගේ දේහය රැගත් වෑන් රථයට ජර්මානු ජාතික බාබරා වොයින් නැමැති කාන්තාව ගොඩ වී නැවත බැස ගිය බවට කතාවක් පවතී.

මෙම දඩබබ්ර පන්දු යවන්නා ලංකාවට සුනාමි ව්‍යාසනය පැමිණි අවස්ථාවේ බොහෝ සෙයින් උදව් උපකාරද කළේය. ජීවිතයේ සැදෑ සමය අහිමි වී ගිය මොහු ජීවත්ව සිටි කෙටි කාලය තුළ රටට ඉමහත් ගෞරවයක් ලබා දුන්නෙකු වශයෙන් ඕස්ට්‍රේලියා වංශ කතාව තුළ ඔහුගේ නම සනිටුහන් වෙනු ඇත.


## Ceylon Shipping Lines Ltd.
### Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

**Ceylon Shipping Lines Ltd.,**
**Printing Department,**
**No. 758/3, Dr. Danister De Silva Mawatha,**
**Colombo 09.**
**Tel: 011 - 2683237 Fax: 011 - 2683238**
**E- mail: cslpri@sltnet.lk**

**Head Office:**
**Ceylon Shipping Lines Ltd.,**
**No. 450, D.R. Wijewardana Mawatha,**
**Colombo 10.**
**Tel: 011 - 2689500 - 8**



# ගාලු මුවදොර විරෝධය

මෙවර සිංහල හින්දු අලුත් අවුරුද්ද උදාවන්නේ ගාලුමුවදොර තරුණ උද්ඝෝෂණයක්ද සමගිනි. වෙනදා සිංහල හිංදු අලුත් අවුරුද්දට රට පුරා කඩ සාප්පු පිරී ඉතිරී ගොස් ජනයා අවුරුදු වෙනුවෙන් විවිධ දෑ මිලදී ගනු ලබත්. එහෙත් මෙදා එය ඒසේ නොවුණු අතර උද්ඝෝෂණ මාතෘකාව තුළම අවුරුදු ද උදාවිය.

**මේ තරුණ පිරිස ඉල්ලන්නේ කුමක්ද? ඒ රටට වෙනසකි. දේශපාලන ධාරාව තුළින් එය කෙතරම් අපේක්ෂා කළද ඉටු නොවුණි. ඉන් පසු අරගලය පාරට පැමිණ තිබේ. දැන් රට උන්නු තැනින් පහළට ඇද වැටී ඇත. රාජ්‍ය පරිපාලනය සහමුලින්ම අකාර්යක්ෂම වී ඇත.**

මේ තරුණ පිරිස ඉල්ලන්නේ කුමක්ද? ඒ රටට වෙනසකි. දේශපාලන ධාරාව තුළින් එය කෙතරම් අපේක්ෂා කළද ඉටු නොවුණි. ඉන් පසු අරගලය පාරට පැමිණ තිබේ. දැන් රට උන්නු තැනින් පහළට ඇද වැටී ඇත. රාජ්‍ය පරිපාලනය සහමුලින්ම අකාර්යක්ෂම වී ඇත. කර්මාන්ත වැසෙමින් පවතී. සාමාන්‍ය ජනයාගේ දෛනික ආදායම් බිඳ වැටී ඇත. වැඩ පල රැකී රක්ෂා වලට යන ජනයා අන්ත අසරණ වී ඇත. ඔවුන්ට යාම් ඒම් කරගැනීමට නොහැකිව මහපාරට ගාල් වී ඇත. දැන් වන විට අගක් මුලක් සොයා ගත නොහැකි තැනට පඹගාලේ පැටලුනු නරියාගේ තත්ත්වයට රජය ඇද වැටී ඇත. නමුත් පුදුමයක මහත නම් දේශපාලකයින් හා ජනතාව ගෙන් බහුතරය මේ සිදුවී ඇති සන්තෑසිය තේරුම් ගෙන නොමැති වීමයි. ඒ තරමට ඒ පිරිස් ලෝභ ද්වේෂ මෝහ යන අකුසල මූළයන්ගෙන් සිත් දූෂිත කරගෙන ඇත. තාමත් බොරදියේ මාලු බාති.

හැත්තෑහතර වර්ෂයක් පුරා ආ ලංකාවේ ආර්ථික දේශපාලන සමාජීය ක්‍රමවේදයේ වෙනසක් මෙම තරුණ පිරිස් ඉල්ලන බව පැහැදිලිය. ඔවුන් ඉල්ලන දේ දෙන්නට වර්තමාන දේශපාලන පැලැන්තිය පොහොසත්ද යන්න ප්‍රශ්නයක් පවතී. ඔවුන් මෙය "සිස්ටම් චේන්ජ්" එකක් කියාද කියති. මේ සිස්ටම් එක වෙනස් කිරීම දැන් පහසු නැත. ඒ සඳහා තිබූ අවස්ථා රැසක් අපේ දේශපාලකයින් විසින් අතහැර දැමීය. ඇත්තටම ඔවුන් එය අතහැරියා නොව හැමදාම ඔවුන් රැගෙන ආ ඔවුන් දැන සිටි එකම සිස්ටම් එක මෙය පමණි. පවතින ක්‍රමයෙන් එහා වෙනස් වූ සිස්ටම් එකක් ඔවුන් දන්නේ නැත. ඔවුන් දන්න එකම සිස්ටම් එක මෙම ගතානුගතික වැඩ වසම් සුරාකෑමේ ක්‍රමය පමණි.

මෙම හිඟාකන ආර්ථික රටාව ගොඩනැගුවේද දේශපාලකයින් විසිනි. එයෙ වෙනස් කල හැක්කේද ඔවුන්ට පමණි. මේ අතර වෙනස් විදියකට සිතන තවත් පිරිසක් සිටිති. ඒ ඔවුන් විසින්ම තම මනසින් පවතින සිස්ටම් එකෙන් ඉවත්වීමයි. සමහරු විදේශගත වී තමාට හරියන වෘත්තියක යෙදී අරගලයෙන් දුරස්වී ස්වාධීන වීමයි. තවත් පිරිසක් තමාට රිසි වෘත්තියක් තෝරාගෙන රට වෙනුවෙන් තමන්ට ලබා දිය හැකි දායකත්වය ලබා දෙමින් පවතින සිස්ටම් එකට පිටින් ජීවත් වෙති. තවත් පිරිසක් ජල ප්‍රහාර කමින් කඳුලු ගෑස් කමින් මහ පාරවල වේලෙමින් තෙමෙමින් අතපය විසි කරමින් ආණ්ඩුව සමග හැප්පෙති.

අද ලෝකය තුළ පවතින ඩිජිටල් තාක්ෂණය විසින් ලෝකය අද බෙදා වෙන් කර නැත. අද ඇත්තේ විශ්ව ගම්මානයකි. එම ගම්මානයේ අපි කුඩා නියම් ගමක් පමණි. මේ විශ්ව ගම්මානයේ අපි සිතන පතන ආකාරයට අනුගතවීමට හැකි ස්ථාන බොහෝය. අද අපි සිටි තැන සිටම ලෝකය හා බද්ධ විය හැක. වර්තමාන තරුණ තරුණියන්ට එය වඩාත් පහසුය. 225 ක් සමග රණ්ඩුවෙවී ඉන්නවාට වඩා ලෝකය සමග තමා බද්ධ වී සිටී නම් එය වඩාත් අගනේය. මිනිස් සිත කිසි විටෙක සංතුෂ්ටියට පත්කර අවසන් කළ නොහැක. උද්ඝෝෂණය තුළ ඇත්තේද අසංතෘෂ්ටියම පමණි. අරගලයේ අපේක්ෂාව ඉටුවීමෙන් පසුද ඇත්තේ අසතුටකි. හේතුව කිසිවක් ස්ථිර නොවන බැවිනි.

නමුත් තමා විසින් සොයා ගන්නා විමුක්තිය හෝ විකල්පය හෝ වෘත්තිය හෝ එසේ නොවේ. එය යම් කාලයක් පවතිනවා පමණක් නොව අරගලයේ හෝ පාලනයේ පාර්ශ්වයක් නොවී මැද සිට දෙපැත්ත ම විචාර බුද්ධියෙන් බැලීමේ හැකියාව ලැබෙනු ඇත.

රාජ්‍ය අනුග්‍රහයෙන් "සිස්ටම් චේන්ජ්" වීමේදී හුදකලාව ස්වාධීනව තම තමන් ස්ව උත්සාහයෙන් වෙනස්වනවා මෙන් නොව ඒ සඳහා දස දහස් ගනනකට ඉඩකඩ සැලසෙනු ඇත.

ලංකාවේ මින් පෙර "සිස්ටම් චේන්ජ්" වූ අවස්ථා දෙකක් විය. ඉන් පළමු වැන්න 1956 බණ්ඩාරනායක රජය මගින් ඉන් සිදුවූ සමාජ පෙරළිය අති මහත්ය. ඇත පිටිසර වන්නි හත් පත්තුවේ හේන් වල පැල් කොට අටවාගෙන කුරක්කන් තලප කකා සිටි ඇදි වත පමණක් තිබූ දූ දරුවන් විශ්ව විද්‍යාල වලට පැමිණ අද වන විට මහා වියතුන් බවට පත්වී සිටිති. ඔවුන් 56 දරුවෝ යන අනවර්ත විරුදාවලිය ලබා සිටිති. ඒ සිස්ටම් චේන්ජ් එකෙන්ම අධ්‍යාපනය ලබා ලෝකය දුටු ඔවුන් ගේම සමහර පිරිස් එය නිර්දය විවේචනයට ලක් කරමින් බන්ඩාරනායක නාමය පවා ඝාතනයට ලක් කිරීමට වලිකෑහ. වලිකති.

බණ්ඩාරනායක විප්ලවය තුළ සිදුවූ මූලික වෙනස වූයේ අධ්‍යාපනික උගතුන් පිරිසක් බිහිවීමය. ඔවුන් බුද්ධිමතුන් වූහ. ලෝකය පිළිගත්හ. ඔවුන් සමාජ ක්‍රියාධරයන් බවට පත්වූහ.

ඊළඟ සිස්ටම් චේන්ජ් එක සිදුවූයේ 1977 දී ජේ. ආර්. ජයවර්ධන රජය යටතේ ය. අද සිටි වැඩි දෙනෙකුට එය මතකය. ඒත් ඔවුන් පෙර සිදුවූ වෙනස නොදුටුහ. එහි මූලික වෙනස වූයේ ආර්ථීක වෙනසකි.

14 වෙනි පිටුවට...

13 වෙනි පිටුවෙන් ...

# ගාලු මුවදොර විරෝදය




**රටකට සමාජයකට දරාගත හැක්කේ 56 හා 77 යන සමාජ වෙනස්වීම්වල සංකලනයකි. මානව ගුණ ධර්ම වැඩෙන උගතුන් බිහිවන ශක්තිමත් ආර්ථික පදනමක් ඇති වර්තමාන දියුණු තාක්ෂණික ලෝකයට අනුගත නැති උගතුන් වියතුන් බිහිකරන සමාජ අධ්‍යාපන සංස්කෘතිකමය ආර්ථිකමය වෙනසක්ය. ඒ වෙනස කෙසේ නම් ලබාදිය හැකිද?**

එම වෙනස තුළින් සම්ප්‍රදායික ධනපති පංතිය විනාශ වී අලුත් ධනපති පංතියක් බවට පත්විය. එහෙත් බොහෝ දෙනෙකු තුළ සමාජය පිළිගත් යහපත් මානව ගුණධර්ම නොතිබුණි. වංචාව දූෂණය හොරකම එහි මුල බීජයන් බවට පත්විය. වර්තමාන දේශපාලකයින්ගෙන් බහුතරයද එම පංතියේම කොටස් ය. එම වෙනස තුළ සමාජ සාරධර්ම වැළලී ගිය බැවින් එයට යහපැවැත්මක් නොමැති විය. එයින් ඔද්දල් වී ගිය බැට කෑ පීඩාවට ලක්වූ සමාජ පංතිය අද ගාලුමුවදොර නැවත ඉල්ලා සිටින්නේ සමාජ වෙනසකි. ක්‍රමයේ වෙනසකි.

රටකට සමාජයකට දරාගත හැක්කේ 56 හා 77 යන සමාජ වෙනස්වීම්වල සංකලනයකි. මානව ගුණ ධර්ම වැඩෙන උගතුන් බිහිවන ශක්තිමත් ආර්ථික පදනමක් ඇති වර්තමාන දියුණු තාක්ෂණික ලෝකයට අනුගත විය හැකි උගතුන් වියතුන් බිහිකරන සමාජ අධ්‍යාපන සංස්කෘතික හා ආර්ථිකමය වෙනසක්ය. ඒ වෙනස කෙසේ නම් ලබාදිය හැකිද?

දැන් වන විට ප්‍රශ්නය සංකීර්ණ වී ඇති බැවින් තරමක් දුෂ්කරය. ඒ සඳහා ප්‍රතිසංස්කරණ කීපයක් කළ යුතුව ඇත. පළමුව නීති රාමුව ශක්තිමත් කළ යුතුව ඇත. මන්ත්‍රී හා ඇමති වරප්‍රසාද ඉවත් කළ යුතුව ඇත. විවිධ තනතුරු උදෙසා ලබා දී ඇති රටට ඔරොත්තු නොදෙන තරම් වූ වරප්‍රසාද හා දීමනා ඉවත් කළ යුතුව ඇත. අධ්‍යාපන රටාව සහමුලින්ම වෙනස් කර ලෝකයට අදාළ වන ලෝකයේ පවතින රැකියා වෙළඳ පොළට ගැලපෙන ශ්‍රමිකයන් බිහි කරන අධ්‍යාපන රටාවකට පරිවර්තනය විය යුතුය. ආර්ථිකය ගොඩ නැගීම සඳහා දසවසරක කැපවීමකට ජනතාව පෙළ ගැස්විය යුතුය. මෙවැන්නකට දේශපාලන පක්ෂ ජනතාව සූදානම් නොවන තාක්කල් අර්බුධය එලෙසම පවතිනු ඇත.

අපේ රටේ ඇති පංගුපේරු දේශපාලනය විසින් ඒ සඳහා ඉඩකඩ සකසා දෙනු ඇතැයි සිතිය නොහැක. හැමෝම බලාසිටින්නේ නව ප්‍රතිසංස්කරණ අරඹන විට බලයේ සිටිය යුත්තේ තමා හෝ තම දේශපාලන පක්ෂයයි යන ආකල්පයයි. මෙය එම දේශපාලන පක්ෂ වලට හා පක්ෂ නායකයින්ටත් එම පක්ෂ වලට බෙදී සිටි පුරවැසියන්ටත් තිබෙන මානසිකත්වයයි. පළමුව තම තමා විසින් මෙම රෝගය සුවපත් කර ගත යුතුව ඇත. කරන චේන්ජ් එක කුමක් වුවත් එය වලංගු වන්නේ විසිපස් වසරකට පමණි. නැවත වෙනසකට යා යුතුය. සෑම දෙයක්ම ඉදිරි වසර 25 ක් දුරට සැලසුම් කළ යුතුය.

දැන් සිදුවී ඇත්තේ ආරම්භය ලබාග ැනීමට තරම් ශක්තිමත් කණ්ඩායමක් වර්තමාන පාර්ලිමේන්තුව තුළ නොසිටීමයි. පාර්ලිමේන්තුව ඉවත දමා පවතින නීති රාමුවට පිටින් එවැන්නක් කිරීමේ හැකියාවක් නැත. එය පවතින පාර්ලිමේන්තුව තුළින්ම සිදුවිය යුතුය.

ඒ සඳහා විකල්ප දෙකක් ඇත. උගත් බුද්ධිමත් ප්‍රතිපත්ති සම්පාදකයින් 20 ක් පමණ බාහිරින් සොයා ගෙන ඔවුන්ට ඇමතිකම් දීමය. ඒ සඳහා වර්තමාන ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරු 20 ක් ඉවත් වී ඒ අයට එම අවස්ථාව දිය යුතුය. මන්ත්‍රී ධූරය පරිත්‍යාග කිරීමට තරම් කැපවීමක් කළ හැකි පරාර්ථකාමීන් 20 ක් මෙම පාර්ලිමේන්තුව තුළ නැත. ඒ නිසා එම අරමුණ ඉටු නොවේ.

දෙවන විකල්පය උගුන් පිරිසක් තෝරාගන පාර්ලිමේන්තුවට පිටින් මණ්ඩලයක් ස්ථාපිත කොට සියලු පක්‍ෂ ඒකරාශි වී ආණ්ඩුවක් පිහිටුවා උගතුන්ගේ මණ්ඩලය විසින් ලබාදෙන තීන්දු තීරණ ක්‍රියාවට නැගීමයි.

සෑම පක්ෂයක්ම ගෙඩිය පිටින් බලය ඉල්ලන බල පොරයක සිටින බැවින් හා දේශපාලන බෙදීමත් කුලල් කා ගැනීමත් හේතුවෙන් මෙම පක්ෂ එකතු වේයැයි සිතිය නොහැක. ආත්මාර්ථකාමී බල ලෝභීන් ගේ උද්දච්ච ගති නිසා අනුන්ගේ උපදෙස්වලට කටයුතු කිරීමට සිතාවි යැයි සිතිය නොහැක.

මේ කරුණු දෙක හැර විකල්ප නොවන කළ සිදුවන්නේ මේ පිරිස අතරම පිරිසක් විසින් එහාට මෙහාට වැනෙන තම බලය සුරැකෙන ආකාරයට ගරා වැටෙන ආණ්ඩුවක් පවත්වාගෙන යෑමයි. එයින් මෙම මූලික ප්‍රශ්න වලට වත් විසඳුම් ලැබෙන්නේ නැත.

සිදුවන්නේ රට තව තවත් ණය කන්දක සිරවෙමින් දිනෙන් දින පහළට ඇදී යාමක් පමණි. එබැවින් ඉදිරිය අවිනිශ්චිතය බියකරුය අඳුරුය මහා දැවැන්ත විනාශයක් අභිමුව අපි සිටින බව පමණක් සිහි තබාගන කටයුතු කිරීම තුළින් තම තමන්ට යම් පිළිසරණක් තමාටම සපයාගත හැකි වීමක් පමණි.






衞生防護中心 Centre for Health Protection
更多防疫資訊 For more information on fighting the virus: www.coronavirus.gov.hk
衞生防護中心Facebook專頁 Centre for Health Protection Facebook Fanpage fb.com/CentreforHealthProtection
衞生署 Department of Health
二零二零年三月製作 Produced in March 2020

# ආකර්ශණීය මුදලකට ගුවන් ටිකට්පත් මිලදී ගත හැක.




ඩුබායි කටාර් කුවේට් ඕමාන්

සවුදි ලන්ඩන් පැරිස් කැනඩා

ඕස්ට්‍රේලියා මාලදිවයින ඉතාලි ජපානය

## ඇතුළු ලොව ඕනෑම රටකට ගමන් කිරීම සඳහා...

## වැඩි විස්තර සඳහා අමතන්න...

**සීමිත සිලොන් ෂිපිං ලයින්ස් සමාගම,**
**450, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**
**දුරකථන : 011-2689500-8**

CSL TRAVELS

IATA ACCREDITED AGENT

M - 077-2672970
077-3572835
077-3561210

E - csltravels@sltnet.lk

# වරින් වර එන නරක කාල

**අද අපි ගෙවන්නේ ඉතා දුෂ්කර කාලයකි. අද ඇති දුෂ්කරතා ගැන කිසිවෙක් කිසිවෙකුට අමුතුවෙන් කිව යුතු නොවේ. මෙවැනි කාල මින් පෙර නොතිබුණිද? ඈත අතීතයේ සිටම පැවත ඇත. පෙර රජ දවස පටන් යම් යම් කාලවල මෙවැනි අති දුෂ්කර අවදි අපි ගෙවා ඇත. ඉන් ප්‍රධාන තැනක් ගන්නේ වලගම්බා රජ සමයේ පැවැති නියං සමයයි.**

මෙය දොළොස් අවුරුද්දක් තිබූ නියං කාලයකි. ආහාර හා වතුර නැතිව ජනතාව තැනින් තැන මැරී වැටෙන තත්ත්වයට පත් විය. දානය අහිමි වූ රහතන් වහන්සේලා පවා පිරිනිවන් පෑ බව ඉතිහාස ග්‍රන්ථ වල දැක්වේ. බුදු දහම රැක ගැනීම සඳහා ත්‍රිපිටකය වනපොත් කළ රහතන් වහන්සේලා රට හැර ගොස් නියං සමය අවසන් වූ පසු ආපසු ලක්දිව වැඩම කළ බව දැක්වේ. එය දීර්ඝ හා අතිශය විනාශකාරී සමයක් වූ බැවින් ඉතිහාස ග්‍රන්ථවල වැඩි ඉඩක් ඇතිව ලියවී ඇත.

1815 සමය මෙරට රාජ වංශය අවසන්ව ඉංග්‍රීසීන් අතට රට පත්වූ ඒ සංක්‍රාන්ති සමයද රටේ රාජ්‍ය පාලනය අහිමිව ගොස් ජන ජීවිතය කඩා වැටී අරමුණක් නැති අපේක්ෂා භංගත්වයට පත්ව රාජ්‍ය අනුග්‍රහයක් ජනයාට නොමැතිව ගෙවී ගිය කාල වකවානුවකි.

අනතුරුව එළඹුණ 1818 කැරලි සමයද එසේමය රට පුරා ඉංග්‍රීසි ආණ්ඩුවට එරෙහිව ජනයා කැරලි ගැසූහ. නිවෙස් වල පිරිමි කැරැල්ලට එක් වූ අතර කාන්තාවෝ දුවා දරුවන් සමග වන වැදුනහ. ඉංග්‍රීසි හමුදාව ගම් පිටින් අලු දූවිලි කළහ. විශේෂයෙන් බදුල්ල මොනරාගල හම්බන්තොට ආදී ප්‍රදේශ විනාශ කළහ. සමහර ගම්මාන සහමුලින් විනාශ වූ අතර තවත් ඒවා කැලෑ මැද හුදකලා වූහ. එකල සරල ජීවිත ගෙවූ ජනතාව විඳි දුක් අපමණය. අලයක් කොලයක් දල්ලක් ගෙඩියක් වනාන්තරයකින් සොයාගෙන කුස ගිනි නිවාගත්හ. කෙත් වතු වතුපිටි ගිනි බත් වූහ ගස් යට ගල් යට පවුල් ජීවත් වූහ.

ඊට මෑත යුගය ගත්විට 1940 දශකය ද අති දුෂ්කර ජීවිත ගෙවූ යුගයක් විය. එය ලෝකයම ආහාර අහේනියකින් පෙලුනු යුගයක් විය. ඒ දෙවන ලෝක යුධ සමයයි. කෙසෙල් අල පවා ආහාරයට ගත් බව අපේ පැරණි ගැමියන්ට තාමත් මතකය. කුස ගින්න හා මරණ බිය දෙකම දරාගෙන මේ රටේ පමණක් නොව ලෝකයේ අති මහත් බහුතර ජනයා දිවි ගෙවූහ. එයටම එකතු වූ මැලේරියා වසංගතය ජීවිත විශාල සංඛ්‍යාවක් වලපල්ලට යැවූහ.

ඉන් අනතුරුව 1970 ආණ්ඩු සමයද එසේමය එදා ජනයා ද මහත් දුෂ්කරතා අත් වින්දෝය. එහි වෙනසකට ඇත්තේ යම් අරමුණක් සඳහා අප අපවිසින්ම කළ දුෂ්කරක්‍රියාවකි. හාල් පරිප්පු භූමිතෙල් රෙදි ආදී කොයි දේ ගන්නත් කූපන් පොත රැගෙන සමූපකාරයට හෝ බලයලත් වෙළඳ සැලකට ගොස් පෝලිමේ සිටීමට සිදුවිය. දිස්ත්‍රික්කයකින් දිස්ත්‍රික්කයකට හාල් මිරිස් ආදී භෝග වර්ග ගෙනයෑම තහනම් විය. මෙරට බහුතර ජනයා අපමණ දුක් වින්දෝය. ඒ දුෂ්කර ක්‍රියාව සිදු කළේ දේශීය ආර්ථිකයක් වෙනුවෙනි යම් ප්‍රතිඵලයන් ලැබ එහි ඉලක්කයට ආසන්න වෙද්දි අප විසින් ඒ දුෂ්කර ක්‍රියාව අතහැර දමා ලබාගත් ජයග්‍රහණ අර්ථ ශූන්‍ය බවට පත්කර ගත්තේය. එය වසර හයක තරම් කාලයකි. 1977 දී අපගේ ජීවන රටාව සිතුම් පැතුම් ඇතුළු දේශීය මොඩලය පවා උඩු යටිකුරු කරගන නව ජීවන රටාවකට අවතීර්ණ විය.




එම වෙනස් වීමත් සමගම තාවකාලික සුරපුරයක් වූ ශ්‍රී ලංකාවාසීන්ට 1987-89 කාලය තුළ අත්විඳීමට ලැබුණු අත්දැකීම් අති දුෂ්කර විය. තැන තැන මිනී කඳු ගොඩ ගැසුණු අතර හංදියක් හංදියක් පාසා උද්දේට දක්නට ලැබුණේ භාගෙට පිළිස්සී ගිය මේ රටේ දරුවන්ගේ මළ කඳන්ය. තැන තැන දෙමාපියන් යහළු මිත්‍රයන් ඥාතින් ගේ විලාපයයි. රජයේ දේපල දැවෙමින් පවතී. අත් අඩංගුවට ගැනෙන දරුවන්ගේ මාපියන් නැගූ විලාප රට පුරා දෝංකාරය දෙන්නට විය. රටේ උගත් වියත් උසස් අය ගේ මරණ දිනකට දෙක තුනක් අසන්නට ලැබුණි. රටපුරා ඇඳිරි නීතිය පනවා බඩුවක් මුට්ටුවක් ගැනීමට වෙළඳ සැලක් නැති තරම්ය. බොහෝ ජනයා රාත්‍රියට කැලෑවල කාලය ගෙවූහ.

උතුරු නැගෙ නහිර එක දිගට පැවති යුද්ධයකි. නිරන්තරයෙන් හමුදා සෙබලුන්ගේ මුද්‍රා තබන ලද මිනී පටේටි ගම්මාන වලට ආහ. එක පැත්තකින් එම විලාපය නැගෙන්නට විය. උතුරු නැගෙනහිර විසූ ජනයා විඳි දුක කියා නිමකළ නොහැක. මායින් ගම්මාන වල කුඩා දරුවන් කෑලි කෑලි වලට කපා කොට ගස් ගල්වල ගසා පොළවේ ගසා මරා දමා තිබූ අයුරු දක්නට ලැබුණි. මරාගෙන මැරුණු බෝම්බකරුවන් ප්‍රධාන නගරවලට ඇතුල් වී සිටියහ.

18 වැනි පිටුවට..





17 වැනි පිටුවෙන්..

# වරින් වර එන නරක කාල...

බස් දුම්රිය ප්‍රධාන නගර ජනකීර්ණ ස්ථාන ආදියේ කොයි මොහොතේ බෝම්බ පිපිරී මහා විනාශයක් සිදුවේදෝයි දෙගිඩියාවෙන් බියෙන් ජනයා යද්දී එකම බස් රථයේ හෝ එකම දුම්රියේ හා එක මග සැමියා හෝ බිරිඳ නොයන තත්ත්වයට පත්විය. ඒ හදිසියේ සිදුවීමට ඉඩ ඇති බෝම්බ ප්‍රහාරයකින් දෙදෙනාම එකවර මිය ගිය හොත් දරුවන් අනාථ වන බැවිනි.

අද ඩොලරය 350 ඉක්මවා යද්දී භූමිතෙල් ලීටරය සියයට අඩුව තිබුණද එය ලබා ගන්නට ජනතාව පෝලිමේය. එදා ඩොලරය 25-50 ට තිබූ යුගයේ උතුරු නැගෙනහිර ප්‍රදේශ වල භූමිතෙල් බෝතලය 800 මිලට අලෙවි විය. අද පැය හයක් විදුලිය කැපුනද එදා උතුරු නැගෙනහිර හිර වැසියන් දිනපතාම අඳුරේම විසූහ.

අනූව දශකය වන විට දකුණ සාමකාමී වුවද උතුරු නැගෙනහිර එසේම පැවතුනි. 2009 පසු මුලු දිවයිනේම සාමකාමී පරිසරයක් නිර්මාණය වෙයි. එදා සිට මේ දක්වා ආ ගමනේදී මේ හා සමාන සමහර විට මීටත් වඩා දුෂ්කර වූ කෙටි කාලීන අවස්ථා තවත් තිබුණි.

2021 වන විට අද අපි අත් විඳින අත්දැකීම්ද පෙර මෙන් තවත් එක් සමයකි. මෙහි කුඩා වෙනසක් ඇත. ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ගත් කළ මෙහි වෙනස්කම් දක්නට ලැබේ.

දෙවන ලෝක යුධ සමයේ මෙරට අත් විඳි අත් දැකීම් ඇති 70 දශකයේ සිටි වැඩිහිටියන් 70 දශකයේ කැරලි හා ආහාර හිඟය දැනුනේවත් නැත මන්ද ඊට වඩා දුකක් එදා ඔවුන් ගෙවා තිබූ බැවිනි. ඒ යුගයේ ජනයාගේ අපේක්ෂා ඉතා අඩු මට්ටමක තිබුණි. වාහන සිහිනය සුඛෝපභෝගී නිවාස පමණක් නොව ජීවන වෘතිය පිළිබඳව වුවද එතරම් විශාල අපේක්ෂා නොතිබුණි.

1987 වැනි කාලයට එනවිට ජනතා අපේක්ෂා ඊට වඩා ඉහළ ගොස් තිබුණි. එය එක් විශේෂ හේතුවක්ද තිබුණි. රාජ්‍ය මට්ටමින් පවා ජන මනසට විවිධ අපේක්ෂාවන් සිහින ලෝක පෙන්වා තිබේ. තිස් අවුරුදු යුද්ධය අවසන් කොට හුස්මක් හෙලූ ජනයාට සංවර්ධන සිහිනයේ ගිලී සිටියහ. තැන තැන උත්සව පැවැත්වෙමින් උස් ගොඩනැගිලි ඉදිවෙමින් මං මාවත් ඉදිවෙමින් සංවර්ධනයේ මුව විට සිටින්නාසේ



තරුණ ජීවිත අපේක්ෂා මත ගොඩ නැගුවේ ඒවා මුදුන් පමුණුවා ගැනීමේ විදිමත් වැඩ පිළිවෙලකින් තොරවය.

රටේ පැවතුනත් ඉමහත් අපේක්ෂා පෙරදැරිව බලා සිටින තරුණ්‍යයට එහි අස්වැන්න නොලැබෙන බව පසක් විය. ඊළගට

**තිස් අවුරුදු යුද්ධය අවසන් කොට හුස්මක් හෙලූ ජනයාට සංවර්ධන සිහිනයේ ගිලී සිටියහ. තැන තැන උත්සව පැවැත්වෙමින් උස් ගොඩනැගිලි ඉදිවෙමින් මං මාවත් ඉදිවෙමින් සංවර්ධනයේ මුව විට සිටින්නාසේ රටේ පැවතුනත් ඉමහත් අපේක්ෂා පෙරදැරිව බලා සිටින තාරුණ්‍යයට එහි අස්වැන්න නොලැබෙන බව පසක් විය. ඊළගට ඔවුන් කලේ ආණ්ඩුව මාරුවකට යෑමය.**

ඔවුන් කලේ ආණ්ඩු මාරුවකට යෑමය. ඉන්ද පලක් නොවුණි. නමුත් අපේක්ෂා හා අරමුණු වල අඩුවක් නොවුණි. දිනෙන් දින අපේක්ෂා හා අරමුණු මෝදු වෙමින් ඉදිරියට ආහ. දේශපාලන චෞරයන් විසින් තරුණ සහ ජනතා සිත්වලට කලින් කළට විවිධ විලාශයන් ගෙන් මෙම අපේක්ෂා ඇතුල් කළහ.

විවිධ දේශපාලන මත දරන්නන් විසින් තරුණ අපේක්ෂා ඉටු නොවන අයුරු පැහැදිලි කරමින් අතිධාවනකාරී තරුණ චිත්තාවේගයන් කුලු ගැන්වූ අතර එය පුපුරා ගිය අවස්ථාවක් බවට 80 දශකය හැඳින්විය හැක.

වර්තමානය වන විට එයට වෙනස් ආකාරයකින් ඉස්මතුවී

අති විශාල අපේක්ෂා සමුදායන් සමග අවසන් ආණ්ඩු මාරුවට ජනතාව පය තැබුවේ අවසන් විකල්පය වශයෙනි. ඒ වන විට ශ්‍රී ලංකා රජය පැවතියේ රටට දරාගත නොහැකි ණය කන්දක් හිස මත දරාගෙනය. අරහෙන් මෙහෙන් ණයට ගෙන ඒ ඒ රජයන් විසින් දවස ගෙවාගෙන ගිය නමුදු ණය කන්දේ ස්වාභාවය ජනතාව එතරම් තේරුම් ගෙන නොතිබුණි.

ණය කන්ද පුපුරා යෑමට තවත් වසර කීපයක් ඉදිරියට තිබුණි. ඊට ප්‍රථම ලෝක වසංගතය ඉදිරියට පැමිණියේ අන් සියල්ල යටකරගෙනය වසංගතයේ හා ණය කන්දේ දිග පලල පාලකයන් දැන හෝ නොදැන අතහැර කටයුතු කළේය.

හිඟන්නාගේ පාත්‍රයට හෙනහුරා වැටුණා සේ ණය කන්ද මතට වසන්ගතය පතිත විය. රට කබලෙන් ලිපට වැටුණි. ජනතා අපේක්ෂා සුණු විසුණු වී ගියේය.

ජනයා සතුව තිබූ අවසන් බලාපොරෝතුව ද අවසන් විය. රජයට ණය ගෙවා ගත නොහැකිවා මෙන්ම මේ වන විට ණය ගැනීමටද නොහැකිය. දැන් බඩු ගන්නට මුදල් නැත. අසරණ වී හමාරය. ජේන මානයේ විසඳුමක්ද නැත. ඊළග විකල්පයක්ද නැත. ආපසු මුල සිට බිංදුවේ සිට යෑමට ද නොහැක. හේතුව සිත් තුළ මවා ඇති සිහින ලෝක බිඳගැනීමට කිසිවෙකු කැමති නැත. උසස් රැකියා රජයේ රැකියා වාහන සිහින නිවාස සිහින දැන් සියල්ල සුනු විසුනු වී ගොස් හමාරය.

ආපසු හැරී බලන විට ණය වී කරපු සැනකෙළිය හමාර වී ඇත. ණයට කාපු මගුලකි. මෙතෙක් අප දැකපු සංවර්ධනය සැනකෙළිය සුඛෝපභෝගී ජීවිතය ඉදිකළ සුවිසල් මැදුරු සුඛෝපභෝගී වාහන සියල්ල ණයය. ජනතා පැතුම් ගොඩනැගී ඇත්තේද මෙම ණය කන්ද මතය. දැනුදු වගකිවයුත්තන් දිනපතා වෙර දරන්නේ ණයක් ආධාරයක් සහණයක් කවුරුන් හෝ දේවි යැයි අපෙක්ෂාවෙනි. දැන් වැටී ඇති තත්ත්වයේ හැටියට මේ මොහොතේ ණයක් නොලැබෙන්නේ නම් ඊළග මොහොත ගෙවාගත නොහැකි තත්ත්වයට අප ඇද වැටී ඇත. මෙය ඛේදනීය තත්ත්වයකි.

අපි කැමති වුනත් නැතත් මෙතනින් පහළටද ඇද වැටෙනු ඇත. එය මේ අවස්ථාවේ නොවුණත් ඊළඟ අවස්ථාවක සිදුවනු ඇත. වර්තමාන තත්ත්වය දෙස බලන විට ප්‍රශ්නය පැහැදිලි ය. එහි ප්‍රධාන කාරනා තුනකි.

**ලෝක වසංගතය ඉදිරියට පැමිණියේ අන් සියල්ල යටකරගෙනය වසංගතයේ හා ණය කන්දේ දිග පලල පාලකයන් දැන හෝ නොදැන අතහැර කටයුතු කළේය.**

1. දරාගත නොහැකි ණය බර 2. විදේශ විනිමය නොමැතිකම 3. ආදායම් මාර්ගයක් නොමැති කම

මේ ප්‍රශ්න තුන රටකට පමණක් නොව සාමාන්‍ය පුරවැසියෙකුට වුවද දරාගත නොහැක්කකි.





මේ සඳහා විසඳුමක් යෝජනා කරන පාලන කාරකාදී දේශපාලන හෝ උගත් යැයි සම්මත වූවන් ගෙන් හෝ රාජ්‍ය නිලධාරී මට්ටමෙන් හෝ පිළිගත හැකි විසඳුම් මාලාවක් දක්වා නොමැත. හේතුව මේ රට අද තත්ත්වයට ගෙන ආවේ ඒ පිරිස් විසිනි. ඔවුන් ඒ සඳහා අඩු වැඩි වශයෙන් දායක වී ඇත. මේ සඳහා උපදේශයක් ගන්නවා නම් ගත යුත්තේ අපටත් පහලින් සිටි දැන් අපට වඩා ඉහළින් සිටින බංගලාදේශය වැනි රටකින් මිස අන් කවරෙකුගෙන්ද?.

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
# சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
# Ceylon Shipping Lines Ltd

## ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.

### ඕස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
சி. எஸ். எல். அவுஸ்திரேலியா
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
+61397929877/0061 396023966
+61397924655
cargo@skyway.com.au/www.skyway.com.av

### ජපානය / ஜப்பான் / Japan

ජුරියා ඉන්ටර්නැෂනල්
ஜுரியா இன்டர்நெஷனல்
**Juria International**
+81283205383
+81283205384
Mobile - 0081-(90) 31027600
tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

සර්ෆායර් ඉන්ටර්නැෂනල්
ஷபீர் இன்டர்நெஷனல்
**Sapphire Int.**
Sakae Cho 1 - 15 - 29
Higashimurayanna City, Tokyo - Japan.
042 - 936 - 6517

### සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிட்.
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
+6563966614 / +6563966615
+6563966621
sales@ms5.com.sg / mifras@ms5.com.sg

### දෝහා - කටාර් / தோஹா - கட்டார் / Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
+974 40 414141
+974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
cmb@lanslogistics.com

ගල්ෆ් ෆැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் செர்வீசஸ் கம்பனி
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
+974 44869723
+974 77885503 / +974 77883866
gulffalconcargoqatar@gmail.com

ටයිටැනික් වේස් කොමර්ෂියල් සර්විස්
**Titanic Ways Commercial Service**
8279 King Fahad Road, Al Faiha District
P.O. Box : 9184
Jeddah 22241 - 2158 - Kingdom of
Saudi Arabia
+966126447050 +966 126447050
Mobile: +966556258377 / +94 777901274
mkt@titanicways.com

### මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
603-40421896 / +966 539222031
00966 532480407
jay_langka@yahoo.com
jayalankacargo@gmail.com

### කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
0096522419095, 0096522457315
0096522419098
falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
+9652495858/+9652470862/+96522495898
info@unitedexpresslogistics.com

### ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. / Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சி
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
Fax: +971 4 320 71 71
info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
+971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
+971 42895750
hirumooncargo@gmail.com

ඕෂන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
00971-04-2640054
Mobile - 00971-0555 491 987
oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
+971 6 7480522
lakbimacargo@gmail.com

### බහරේන් / பஹ்றைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
+973 35939343
+973 17 811707
colombosuppliersbhn@gmail.com

### සවුදි අරාබිය / சவுதி அரேபியா / Saudi Arabia

#### Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al
Gahathani Trading Est) Jeddah, K.S.A.
0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
imthiyaz85360@yahoo.ca

#### දමාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
+966550952031

#### රියාද් - ரியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
+966555892754
+966532083640
abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
2442032/4793845/0508273719
4793845 / 00966 - 583090555
fameruhcmb@gmail.com

ජී එම් අයි ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ්
**G M I International Pvt Ltd.**
German
Mobile: +94 777150997
+94 112890099
+94 112890099
indika@gmi.lk

### ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து / Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
0041-796656563 / 0041- 443025838
mcscargo@swissmail.com

### කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
+9056739873
+9056739905
cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

### එංගලන්තය / இங்கிலாந்து / United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
02086680252
info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
**Mass Global Shipping**
044(0)208 4221232
208 8644244
info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
02086489092 / 07908787627
info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
02084596633 / 0794743535
ajantha.atlasshipping@gmail.com

### ඇමරිකාව / அமெரிக்கா / America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
1888 232 1952
nishan@colomboexpress.com
www.colomboexpress.com

ස යු රේ න් එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

# ගොන් කරත්ත යුගයට ගොස් ආපසු එමුද?

අදින් දශක හතර හමාරකට පෙර යුගයේ අද මෙන් යාන වාහන කාපට් කළ පාරවල් රෙදි සෝදන යන්ත්‍ර ශීතකරණ ග්‍රයින්ඩර් හොට් ප්ලේට් රයිස් කුකර් ආදී කී නොකී බලශක්ති යොදා ගත් කාර්ය පහසුකරවන විවිධ තාක්ෂණික මෙවලම් දක්නට නොතිබුණි. ගෘහස්ත විදුලිය විදුලි උපකරණ පාවිච්චියක් ද නොතිබුණි. උලු ඇස්බැස්ටෝස් ශීට් ආදීය වහලයට සවිකළ නිවෙස් ද දක්නට නොතිබුණි.

එකල ගමේ කෙසෙල් කැන් පොල් බුලත් පුවක් ආදිය එකතු කරන කරත්තකරුවා ඒවා නගරයේ සති පොළට රැගෙන ගොස් අලෙවි කරති. සති පොළට යන්නෙකුට දකින්නට ලැබෙන්නේ පාර දෙපස සැතපුමක් තරම්දිගට ගොන්නු බැදගත් කරත්ත නවතා ඇති අයුරුයි. ඈත නගරවලින් එන ලෝරි රථ කීපයක්ද දැකිය හැකිය. බස්රිය දෙක තුනක් ඉද හිට මෝටර් රථ දෙක තුනක් ද නගරයේදී දැක ගැනීමට ලැබේ. කුමන හෝ හේතුවකට වාහනයක් ගමට ඇදුනොත් ගම්වාසීන් නිවෙස් ඉදිරිපිටට විත් එය නරඹති. කොල්ලෝ කුරුට්ටෝ හැකිතරම් දුර ඒ පසුපස දුවයති. අබලං වල ගොඩැලි වලින් යුත් පාරවල් නිසා එය පසු පස දිව යෑමද එතරම් අපහසු නොවේ.

කුස්සියේ තිබූ වංගෙ ඩියයි මොල් ගසයි වී හාල් පිටි ආදිය කෙටීම සඳහා භාවිතා විය. ළිදට හෝ ඇළට යන කාන්තාව රෙදි ගොන්නක් සෝදන්නීය. වර්තමාන ශීතකරණය වෙනුවට පුරාණ ගැමි කාන්තාවන් දුම්මැස්ස භාවිතා කළහ. එහි වියළි ආහාර වර්ග කල්තබා ගනිති. ලාම්පු තෙල් දැමූ කුප්පි ලාම්පුව රාත්‍රියට ආලෝකය ලබාදුන් අතර අසල කඩවලින් ලාම්පුතෙල් කාලක් භාගයක් වශයෙන් මිළදී ගනිති.



අද මෙන් අරුමෝසම් සැලසුම්වලට අනුව තැනූ නිවෙස් එකල නොතිබුණි. මැටි බිත්තියෙන් සකසා ගත් සාමාන්‍ය ප්‍රමානයේ වහළට යොදාගත් පොල් අතු හෝ මානා සෙවිලි කරන ලද නිවෙස් දක්නට ලැබුණු අතර කාමර තුන හතරක් සහිත ගඩොලින් තැනූ තීන්ත හෝ හුණු ආලේප කරන ලද උලු සෙවිලිකළ නිවෙසක් ඇත්නම් ඒ ප්‍රදේශයේ යමක් කමක් කරකියා ගතහැකි වතු පිටි වලින් වැඩි ආදායමක් ලැබූ තරමක ධනවත් අයෙකි. එම නිවෙස්ද රාත්‍රියට ආලෝකය සපයා ගත්තේ ලාම්පු තෙල් කුප්පියෙනි.

මල ගෙදරක් මගුල් ගෙදරක් නෑදෑ ගෙදරක් සඳහා සැතපුම් හත අටක් දුරක ඇති විට ඒ ගමන යන්නේ සැතපුම් දෙක තුනක් පයින්ම ප්‍රධාන මාර්ගයකට පැමිණ රජයේ ප්‍රවාහන සේවයට අයත් බස්රියෙන් හෝ දුම්රියෙනි. එය සැතපුම් තුන හතරක දුර නම් පයින්ම යති. තවත් විටෙක මුලු ගමනම වුවත් පයින් යන්නට සිදුවන්නේ ගමනා ගමන පහසුකම් නොමැති ප්‍රදේශයක වූ විටය. මෙවන් ගමන් සඳහා ගැමියා එතරම් කම්මැලි කමක් දක්වන්නේ ද නැත. ගමේ සමහර නිවෙස් වල පාපැදියක් තිබුණි. එහි හිමිකරුවා තරමක වත්කමක් ඇති අයෙකි. මෝටර් රථයක් ඇත්තෙකු වේ නම් ඔහු ධනවතෙකි. යම් අයෙකුට ලෙඩක් දුකක් අසනීපයක් වූ විට ගමේ හැඩි දැඩි තරුණයින් මෝටර් රථය ඇත්තාගේ නිවසට ඉතා වේගයෙන් දිව යති. මෝටර් රථය රෝගියාගේ නිවසට එන තෙක් අවට වාසීන් රෝගියා පුටුවක තබාගෙන හෝ කරේ තබාගන හෝ මගට එති.

එදා අද මෙන් පෞද්ගලික අංශයේ රැකියා තිබුනේම නැති තරම්ය. රජයේ රැකියාවක් කරන්නෙකු ගමේ ඉදහිට දක්නට ලැබුණි. ගුරුවරයෙක් ලිපිකරුවෙක් ආදී රැ කියාවකි. එවැන්නෙකුට බොහෝ විට පාපැදියක් ද තිබුණි. සෙසු ගැමියන් වතු පිටි වල වැඩ කරමින් ගොවිතැන් කරමින් එදා වේල සරිකර ගත්හ. ඒවායින් ලැබෙන අස්වැන්නෙහි අතිරික්තයක් වේ නම් එය අසල කඩයකට හෝ සතිපොලට රැගෙන ගොස් අලෙවි කොට සුලු මුදලක් උපයා ගත්හ. එසේ උපයා ගන්නා මුදල සපයා ගත නොහැකි පවුලේ අවශ්‍යතා සඳහා පිරිමසා ගැනීම ගැමියා ගේ සිරිතයි. ජීවන රටාව ඉතාම සරල බැවින් අවශ්‍ය දෑ ඉතා අඩු මට්ටමක තිබූ බැවින් එසේ උපයා ගන්නා මුදල ඇති මදි ගනන්ය.



අද ප්‍රධාන නගරයක දක්නට ලැබෙන යාන වාහන විදුලිය සහිත නිවෙස්, කඩ සාප්පු වීදි ලාම්පු තට්ටු ගොඩනැගිලි එදා දක්නට ලැබුණේ අගනුවරය. මීට දශක හතර හමාරකට පෙර තිබූ අගනුවර වර්තමානයේ සාමාන්‍ය නගරයක මට්ටම විය. අද ගම්වල ඇති පහසුකම් එදා තිබුණේ ප්‍රධාන නගරවලය.

ඇදිරි වැටීගෙන එනවිට සිය දෛනික කටයුතු හමාර කරන ගැමිය නාගෙන නිවෙස් වලට කොටුවෙති.

සමහරු අසල කඩයක් ලගට යති. තවත් අය ලගපාත නිවෙස් වලට ගොස් රාත්‍රී හත අට වනතුරු විවිධ වූ කයිවාරු ගසමින් අල්ලාප සල්ලාපයේ යෙදෙති.

කුඹුරු පිටි වතුපිටි නිවෙස් ආදියේ තනියම කරකියා ගත නොහැකි වැඩ සිදුවන්නේ අත්කම් ක්‍රමයටය. නිවෙසේ පොල් අතු බැදීය යුතු නම් අසල් වාසීන් පහළොවක් විස්සක් එයට එක්වෙති. කුඹුරේ සී සෑම, වී වැපිරීම, ගොයම් කැපීම මේ ආදී සියලු කටයුතු එකිනෙකාට උදව් වෙමින් ඔවුනොවුන්ම එය ඉටුකර ගනිති. ඒ නිසාම ගම්වාසීන් ඔවුනොවුන් අතර පැවතුනේ ඉතා විශ්වාසනීය බැඳීමකි.

> කුඹුරු පිටි වතුපිටි නිවෙස් ආදියේ තනියම කරකියා ගත නොහැකි වැඩ සිදුවන්නේ අත්කම් ක්‍රමයට ය. නිවෙසේ පොල් අතු බැදීය යුතු නම් අසල් වාසීන් පහළොවක් විස්සක් එයට එක්වෙති. කුඹුරේ සී සෑම, වී වැපිරීම, ගොයම් කැපීම මේ ආදී සියලු කටයුතු එකිනෙකාට උදව් වෙමින් ඔවුනොවුන්ම එය ඉටුකර ගනිති. ඒ නිසාම ගම්වාසීන් ඔවුනොවුන් අතර පැවතුනේ ඉතා විශ්වාසනීය බැදීමකි.

ඔවුනොවුන් එකතුවී දිනයක් කතා කරගෙන වල්වැදුනු, වැසි ජලයෙන් කැඩී බිඳී ගිය ගමේ

21 වෙනි පිටුවට

20 වෙනි පිටුවෙන්....

# ගොන් කරත්ත යුගයට ගොස් ආපසු එමුද?

පාරවල් එළිපෙහෙළි කර සකසා ගනිති. පන්සල් වත්ත සුද්ද කරති. ඇලවේලි බැද ගනිති. අලුත්වැඩියා කරති. තම තම නිවෙස් වල ඇති අතිරික්ත එළවලු කෑම බීම අසල්වාසී නිවෙස්වලට හුවමාරු කර ගනිමින් සහජීවන ජීවන රටාවක් ගොඩනගා ගනිති. අයෙකු ගේ විපතකදී කරදරයකදී එකාවන්ව පිහිට වෙති. ඔවුනොවුන් අතර බැදීම ඉතා ශක්තිමත්ය.

මේ නිසාම ඒ ඒ කාර්යන්ට ආවේනික වූ මනා සංස්කෘතියක් බිහිවිය. හේනට කුඹුරට නිවසට ගමට වෙන් වූ උප සංස්කෘතීන් බිහි වූ අතර එය ගමක් සමාජයක් අතර මනාව බැඳී පැවතුනි. එය සමස්ත රටේම සංස්කෘතිය විය. එකිනෙකා අතර තිබූ අන්‍යෝන්‍ය විශ්වාසය තුළ එකිනෙකාට රැකවරණය තිබුණි. ගමේ සිටිහැම අයෙක්ම ඥාතියෙක් විය. අසවල් මාමා, අසවල් අයියා, අසවල් නැන්දා ආදී වශයෙන් ඥාතිත්වයෙන් කතා කිරීමට ඔවු නොවුන් බැදී සිටියහ. ඔවුන්ට ගරු කළහ. ඒ නිසාම දූ දරුවන්ට සමාජ රැ කවරණයක් ලැබුණි. පාරක තොටක පයින් තනියම යෑමට කිසිවෙකු බියක් දැක්වූයේ නැත. අවට නිවෙස් වාසීන්ද මග තොටේ හමුවන්නන්ද දන්න අඳුරන අය වූහ. දරුවන් වැරදි වැඩවලටද නොපෙළඹුනාහ. ඒ ගමේ කිසිවෙකු හෝ එය දැනගත හොත් ඒ සඳහා එයට අනුබලයක් නොලැබීම පමණක් නොව දඩුවම් ද ලැබෙන නිසාය.

මෙම යුගයේ අද අපි කතාකරන දියුණුව, සංවර්ධනය, නවීනත්වය කියන තට්ටු නිවාස උස් ගොඩනැගිලි යාන වාහන තාක්ෂණික මෙවලම් නගරයට හා නගරවාසීන්ට පමණක් සීමාවිය. එය ඉබි ගමනින් ඉතාම සෙමින් එම නාගරික දියුණුව ප්‍රසාරණය වෙමින් තිබුණි. එය ගමට දැනුනේම නැත. ගම්වාසීන් එය ගනන් ගත්තේද නැත.

එකල ඒ ගැමියන් ස්ව උත්සාහයෙන් පරිසරය



හා බද්ධ වී චාම් සරල රටට බරක් නොවී සැහැල්ලුවෙන් එක මිනිස් පොකුරක් සේ ජීවත් වූහ. ඒ ආභාශයන් තාමත් ඉස්මතු වන අවස්ථා ගම්මට්ටමින් දැකිය හැකිය. විශේෂයෙන්ම කොවිඩ් වසංගතයේදී එම රෝගී පවුල් වලට ඒ ඒ අසල්වාසීන් යහමින් සැලකූහ. රජයෙන් දුන් දීමනා මෙන් දහ පහලොස් ගුණයකින් ගම්වල රෝගීන්ට උපකාර වී ඒ ඒ



ප්‍රදේශවල අය අදද ලබා දෙති.

මෙසේ රටේ සමාජ ආර්ථික සංස්කෘතික පසුබිම පවතිද්දී බල ලෝභය පමණක් අරමුණ කරගත් දේශපාලන නායකයින් මෙරට අහිංසක ජනයා ගේ මොළ තුළට විවිධ බලාපොරොත්තු අදහස් දමමින් මොළ සේදුවේය. ජනමනස විකෘති කොට ඔවුන්ගේ ස්වාභාවික චින්තන රටාව උඩු යටිකුරු කළහ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් හැත්තෑව දශකය අවසන් වී 80 දශකය ආරම්භවීමත් සමග "කඩිනම් සංවර්ධනය" යන රටාව රටට ආදේශ කර " විවෘත්ත ආර්ථිකය" යන සංකල්පය බිහි කළේය.

පාරවල් තැනිනි, ගමට විදුලිය යාන වාහන විදුලි උපකරණ මිනිස්සු කිසිදා අසා නොතිබුණු දැක නොතිබුණු තාක්ෂණික මෙවලම් කඩ සාප්පු වල ගොඩගැසුහ. මේ සියල්ල එතෙක් මෙතෙක් දැක නොතිබූ ගැමියන්ට අවශ්‍ය විය. එතෙක් පැවතුනු සහජීවන සංස්කෘතික ජීවන රටාවට පයින් ගැසූ ගැමියා ඒවා පසුපස හතිදාගෙන දුවන්නට විය. ඒවා ගන්න නම් මුදල් අවශ්‍යය. එසේ නම් කෙසේ හෝ මුදල් ඉපයිය යුතුය.

පළමුව සහජීවනය ඉවතලීය. සෑම දෙයකටම මිලක් නියම විය. උදව්වට වැඩ කිරීම නවතා දැමීය. උදව් කිරීමෙන් මුදල් ඉපයිය නොහැක. මුදල් උපයන ක්‍රම බොහෝ ඇත. ණයට ගැනීම එකකි. වංචා කිරීම තව එකකි. සොරකම, පගාව, කොමිස්, මත්ද්‍රව්‍යය අලෙවි කිරීම, බෙදාහැරීම, ගෙන්වීම අධික ලාභයට භාණ්ඩ අලෙවි කිරීම වැටුප් ලබන රැකියා සොයා ගැනීම වැඩි වැටුප් උපයා ගැනීම ආදී කෙසේ හෝ හිමින් හිමින් පොහොසත් වී මෙම විවෘත්ත ආර්ථිකය සංකල්පය ජයගත නොහැක. ඒ සඳහා ක්ෂණික මුදල් අවශ්‍යය. මේ රටට විදේශ ශ්‍රම වෙළඳ පොළ ද ලැබුණි. ගමේ ගොඩේ කාන්තාවන්ට විදේශ වල ගෘහ සේවයට ඉල්ලුම ලැබුණි. කාන්තාවන් දරු පවුලෙන් වෙන්ව නන්නාදුනන රටවල මෙහෙකාර කමට යැවිය. ඔවුන් දෙවසරකින් ආපසු එනවිට රූපවාහිනියක් කැසට් රෙකෝඩරයක් ඇතුලු අරුමෝසම් රැසක් ගෙන ආවා පමණක් නොව පිටි කොටන්න ලිපි ගිනි මොලවන්න පොල් ගාන්න ආදී පෙර තිබූ පළපුරුදු හැකියාවන් ද ඉවත දමා ඒවාට අවශ්‍ය මෙවලම් ද රැගෙන ආහ.

මේවා දැකීමෙන් ඊට පෙර එකිනෙකාට උදව් කරමින් සිටි අසල්වාසීන් අතර පවා ඇති වූයේ තරගයකි. තරගය නිසා ඊර්ෂ්‍යාවද සැකයද නිරන්තරයෙන් මෝරන්නට විය. මේ ආදී වශයෙන් වසර විසිපහක් තිහක් යන විට මෙම තරගය උපරිමයට පැමිණි අතර ඒවා සංස්කෘතික අංග බවට පත්විය.

මෙම කාලයන් තුළ ආණ්ඩු මාරු වුවද මෙම සංකල්පීය වෙනස එලෙසම පවත්වාගෙන ගියා පමණක් නොව එය තව තවත් වර්ධනය වන්නට ඉඩ දුන්නේය.

එදා ස්වයංක්‍රීය ආර්ථිකය කාලයක් තිස්සේ වැඩි දියුණු කළ පිරිසට පමණක් සීමා වූ නිවාස යාන වාහන තාක්ෂණික ගෘහ මෙවලම් ගෘහ භාණ්ඩ සෑම ගෙදරකම දක්නට ලැබෙන පොදු භාණ්ඩ බවට පත්විය. මේ සියලු උපකරණ විදේශ රටවලින් ගෙන ආ අතර දේශීයව නිෂ්පාදනය වෙමින් තිබූ කර්මාන්ත ශාලා මෙම විදේශ වලින් ගෙන එන ක්ෂණික මෙහෙයුම් සමග තරග කිරීමට නොහැකි වීම හේතුවෙන් ඒවා එකින් එක වැසී ගියහ. රජයන් හා ජනතාවද ආනයනය ගැනම උදම් අනමින් එයටම නැඹුරු විය. මෝටර් රථ ගෘහ භාණ්ඩ ගණනට වැටුණි. නිවසක මෝටර් රථයක් නැතිනම් එය එම පවුලට විශාල මදි පුංචි කමක් සේ දැනෙන්ට විය. ඒ සඳහා වත්කම නැත්නම් විසඳුම ලීසිංය. එනම් පොලියට ගන්නා ණය මුදලකින් එවැන්නක් මිලදී ගත හැක. නඩත්තුව ගැන පසුව හිතන ගෘහ මූලිකයා පළමු ලීසිං එකක් දමා වාහනයක් ගෙදරට ගෙන එයි.

මේ වන විට බහුතරයක් දෙනාගේ නිවාස ගෘහ භාණ්ඩ ගෘහ උපකරණ ඇතුලු වත්කම් තම ඇත්ත වත්කමට වඩා දහස් ගුණයකින් වැඩිය. ඒ වැඩි ප්‍රමාණය සියල්ලම කොතනකට හෝ ණයකි. මෙම සංකල්පයට දැන් වසර 40 ක් 45 ක් සම්පූර්ණ වී ඇත. අද වන විට එය උච්ච අවස්ථාවට පත්ව ඇත. අවසානයේ බලන විට ජනතාව මෙන්ම රජයද මෙම භාණ්ඩ ලංකාවට අපනයනය කර ඇත්තේ ණයටය. රජයන් විසින් ජනතාවට ලබාදුන් මෙම දිරිච්ච ලනුව දැන් එක් පැත්තක් ජනතාව කන අතර අනිත් කොණ රජය විසින් කයි.

ඉන්දන කොතෙක් ගෙනාවද රට තුළ ඇති වාහන කන්දරාවට එය ප්‍රමාණවත් නොවේ. ගෑස් ගෙන්වා පිරිමැසිය නොහැකි තරම් දර පොල්කොළ වලින් ආහාර පිසූ ගැමි නිවෙස් වල පවා ගෑස් උදුන්ය. ගෙයින් ගෙට විදුලිය කොතෙක් ලබාදුන්නද යත් දැන් විදුලිය නිපදවා පිරිමැසිය නොහැකිය. රජය කළේ රජයේ ආදායමට ඔරොත්තු නොදෙන තරම් ණයට භාණ්ඩ ආනයනය කිරීමය. ජනතාව කළේ ආදායමට ඔරොත්තු නොදෙන තරම් භාණ්ඩ මිලදී ගැනීමය. දැන් දොගොල්ලම සිරවී ඇත. රජයේ සිරවීම දැන් ටික ටික දැනෙමින් පවතී. ජනයාගේ සිරවීමද දැනට ටික ටික දැනෙමින් පවතී. මේ තැනට ඒමට අපට වසර 40 ක් පමණ ගත විය. මෙම හතලිහ තුල ඒ සංවර්ධනය භුක්ති විඳ මියගිය උන් ටික ගොඩය. ඉතිරි උන් ටික විඳවමින් සිටී. හතලිහට එහා දිවි ගෙවූ ඒ ජීවන රටාව යම්තමින් අල්ලා ගෙන සිටි අතලොස්සක්ව සිටින ජනයාට මේ වැඩේට සිනා ය.

වර්තමාන අර්බුදය ටික ටික ජනයාට දැනෙමින් පවතී. ඕනෑම දෙයක් සිදුවන්නේ ක්‍රමානුකූලවය. ගෙන ආ යාන වාහන ගරාජ් වලට ගාල් කර ගොන් කරත්ත භාවිතයට ගැනීමට කාලය එළඹ ඇතත් දැන් ගොන් කරත්තද නැත. ඒවාද අප විනාශ කර ගත්හ. අසල්වාසීන් ආර්ථිකයෙන් පහළට වැටෙනවිට එකිනෙකට උදව් කර ගනිමින් නැවත සහජීවනය ගොඩ නගා ගත යුතුව ඇත.

කඩිනම් සංවර්ධන සැලසුම හතලිස් පස්වසරක් ගෙන ආවත් තාමත් සංවර්ධනයක් නම් දක්නට නොමැත. මෙ අවුරුදු 45 පුරාම අප සිදුකර ඇත්තේ බෙරය පදම් කිරීමය. පදම් කරන අතරතුර දැන් බෙරය පැලී ගොස් ඇත. දැන් අපි ගහපු බෙරයකුත් නැත බෙරයේ පලුවකුත් නැත. අපි දැන් වෙන බෙරයක් පදම් කිරීමට ගත්තොත් නරකද?

# Ceylon Shipping Lines Ltd

450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617











Ceylon Shipping Lines Ltd.

SLSI SYSTEM ISO 9001 CERTIFIED

MGMT. SYS. RvA C 155

PATA Pacific Asia Travel Association

IATA

TAASL

***Serving with Excellence***

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing